# ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

## E Magazine

2024 මාර්තු / 2024 අප්‍රේල්
පළමුවැනි කාණ්ඩය - 3 වැනි කාලාපය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ
මාසික විද්‍යුත් ප්‍රකාශනය



කවරයේ කතාව

29,30,31 පිටු




කවරයේ ඡායාරූප - ගිනි නිවීම් ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

# කතුවැකිය

## සෑම බිම් අඟලකම වවන්න පුරුදු වෙමු



පසුගිය කෙටි කාලය තුළ කැරට්වල මිල අහස උසට ගියේය. "රත්රන්වල බර මිනින්න කැරට් තෝරගන්න හේතුව අපිට දැනුයි හරියටම තේරෙන්නෙ" යැයි ඇතැම්හු විහිළුවටද කීවෝය. පොදුවේ ගත් කල කැරට්වල පමණක් නොව එළවළු, පලතුරු, මස්, මාළු ඇතුළු ආහාර ද්‍රව්‍ය සැමෙකකම පාහේ මිල ගණන් දිනෙන් දින ඉහළ යනුයේ රොකට් වේගයෙනි.

එසේ වූවායැයි කියා අප කිසිවකුට හෝ කුසගින්නේ සිටිය හැකිද? නොහැකිය. එසේ නම් පාරිභෝගික අප කළ යුත්තේ කුමක්ද? මේ ගැටලුවට විකල්පයක් සොයාගැනීමය. එළවළු, පලතුරුවල මිල ගණන් ගැන දැවෙමින් තැවෙමින් සිටිනවාට වඩා ඇත්තෙන්ම අපට කළ හැකි වෙනත් දෙයක් නැතිද? පිළිතුර "ඇත" යන්නය. ඒ කුමක්ද? අපට තිබෙන බිම් අඟලේ හෝ අපට හැකි තරමින් එළවළුවක්, පලතුරක්, පලා වර්ගයක්, කුළුබඩු වර්ගයක් වවාගැනීමය.

මෙවන් වූ උත්සාහවන්ත, නිර්මාණශීලී පුද්ගලයකු පිළිබඳ පසුගිය 'ශ්‍රී පුර' සඟරාවේ 'ජීවිතය ජයගත් මිනිසුන්' නම් විශේෂාංගය යටතේ ලිපියක් පළකළෙමු. ඔහුගේ වගාබිම වී ඇත්තේ ඔබ අප කොයි කවුරුත් පය ගසා සිටින මහ පොළොව නොව සිය සිව්මහල් නිවසේ උඩුමහලය. ඒ වපසරිය පර්චස් හතරහමාරකි. එහි නැති දෙයක් නැතැයි කියන්නට බැරි තරමින් එළවළු, පලතුරු, පලා වර්ග ආදිය හේ වගා කර තිබේ.

ඒ වගාවට කෘත්‍රිම පොහොර අහලකට හෝ වද්දනොගන්නා හේ තමාට ඇවැසි කොම්පෝස්ට් පෙහොර සිය වගා භූමිය තුළදීම නිපදවාගනියි. ඒ, වගා බිමෙන්ම එක්රැස් කරගන්නා කොළ රොඩු, නිවසේ මුළුතැනගෙයින් ඉවතලන අපද්‍රව්‍ය ආදිය යොදාගනිමිනි.

මෙවන් වූ සීමිත ඉඩකඩකින් උපරිම ඵල නෙළාගත් තවත් නිර්මාණාත්මක වගා බිමක තතු දිගහැරෙන ලිපියක් මේ සඟරාවෙන්ද ඔබ වෙත ගෙන එන්නෙමු.

ගේ දොරට අවශ්‍ය එළළුවක්, පලතුරක්, පලා වර්ගයක් තමනට උරුම සීමිත ඉඩකඩ තුළ වුව වගා කිරීමෙන් වසෙන් විසෙන් තොර නැවුම් ආහාරයක මිහිර ඔබට හිමි වනු ඇත. තවද මෙය හරවත් රසවත් විනෝදාංශයක් බවට පෙරළා ගැනීමෙන් ඔබගේ විවේකය අර්ථවත් ලෙස ගතකිරීමේ මහඟු වාසනාවද ඔබට උදාවනු නොඅනුමානය.

**මාධ්‍ය ඒකකය**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**
**රාජගිරිය**


උපදේශකත්වය

**ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය**
(නාගරික කොමසාරිස්)

**රත්නා වසන්ති වික්‍රමරත්න මහත්මිය**
(නාගරික ලේකම්)

සංස්කරණය

**නඳුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**

පිටු සැලසුම්කරණය

**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

ඡායාරූප

**සමීර සඳුන් කුමාර**

**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

විශේෂාංග ලේඛකයන්

**රංජිත් පුෂ්පකුමාර**

**තිළිණ සම්පත්**

**සුනෙත් ජයකොඩි**

**අනුර යහම්පත්**

**නිර්මාණී කොඩිකාර**




ශ්‍රී ලාංකේය ඉතිහාස කතා පුවත තුළ කෝට්ටේ රාජධානි සමය කරුණු කාරණා කිහිපයක් නිසා ගෞරවණීයත්වයට පත්ව තිබේ. පරසතුරු උවදුරු මුලුමනින්ම දුරු කොට ලක් දේශය එක්සේසත් කිරීම, සිංහල සාහිත්‍ය නිර්මාණකරණය කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය උපරිමව ලැබී සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය බවට කෝට්ටේ යුගය පත්වීම ඒ අතර මූලික වේ. එලෙසම ලක් ඉතිහාසයෙහි අඳුරු කාලපරිච්ඡේදයන් කිහිපයක් ද කෝට්ටේ ඉතිහාසය තුළ සනිටුහන් වී ඇත. පෘතුගීසි පාලන සමයෙහිදී ධර්මපාල රජු විසින් කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවක් මගින් පෘතුගාලයට පැවරීම ඒ අතරින් ප්‍රමුඛ වේ. මේ සිදුවීම් කාලානුරූපීව පෙළගස්වමින් කෝට්ටේ ඉතිහාසය කියා දෙන ලිපි පෙළක පියවරකි මේ.



# කෝට්ටේ යුගයේ කීර්තිමත්ම පාලකයා වූ 6 වැනි පරාක්‍රමබාහු රජු

කෝට්ටේ රාජධානි සමයට අප්‍රමාණ කීර්තියක් උරුම කර දුන් ශ්‍රේෂ්ඨතම පාලකයා වූයේ 6 වැනි පරාක්‍රමබාහු රජු ය. මේ රජුගේ පාලන කාලය පිළිබඳ මතවාද කිහිපයක් පවතී. මොහු පිළිබඳ වර්ණනාවන් බොහෝ අඩංගු වන සද්ධර්මරත්නාකරයේ සඳහන් වන්නේ ක්‍රි. ව. 1410 දී රාජ්‍යත්වයට පත්වූ බවය. එහිම තවත් තැනක සඳහන් වන්නේ ක්‍රි. ව. 1415 ලෙසිනි. තවත් ඇතැම් ලේඛනවල ක්‍රි. ව. 1412 ලෙසින් දැක්වේ. කෝට්ටේ රාජධානියේ පාලකයා වීමට පෙර මොහු වසර තුනක් රයිගම සිට රට පාලනය කළේය.

'පැරකුම්බා සිරිත' 6 වැනි පැරකම්බා නිරිඳුන්ගේ ගුණ ගායනා කෙරෙමින් ලියවුණු විචිත්‍රවත් ප්‍රශස්ති කාව්‍යයකි. එහි එන කවියක මේ රජුගේ පෙළපත පිළිබඳ මෙසේ සඳහන් වේ.


**සසිරි මානාවුළු පුරෙහි ඉඳු පරපුරින් ආ පිවිතුරු**
**සවුළු විජයබා නිරිඳු පුත් පැරකුම් රජුන්හට මුණුබුරු**
**ලමැණි ජයමහලෑන හිමි සුරතුර වෙලු රන්ලිය යුරු**
**සුනෙත් මහ දෙවි බිසෝ හිමිලත් රජ රුවක් සොඳ බුදුකුරු**

මේ කවියට අනුව මේ රජුගේ පියා ලමැණි ජයමහලෑන නම් ප්‍රභූවරයෙක් බව කියවේ. ජයමහලෑන ගම්පොළ රජ පරපුරේ ආරම්භකයා වූ සවුළු විජයබාහු රජුගේ පුත් 5 වැනි පරාක්‍රමබාහු රජුගේ මුණුබුරෙකි. සුනේත්‍රා මහ දේවිය මෑණියන්ය.

එසේ වුවත් රාජාවලියේ සඳහන් වන්නේ වෙනත් කතාවකි. එහි එන තොරතුරුවලට අනුව 6 වැනි පරාක්‍රමබාහු රජුගේ පියා විජයබාහු නම් පාලකයෙකි. ඔහු, චීන අධිපතියකු විසින් උපක්‍රමශීලීව චීනයට කැඳවාගෙන යනු ලබයි. ඉන් අසරණ වූ ඒ රජුගේ බිසව වූ සුනේත්‍රා දේවිය සිය පුත් කුමරුන් කැටිව වීදාගම විහාරයට පැමිණ තිබේ.

මෙම කුමරු කෙදිනක හෝ ලංකාවේ රාජ්‍යත්වයට පත්වන බව වීදාගම මෛත්‍රෙය තෙරුන්හට ඒත්තු ගොස් තිබුණේය. ඒ අනුව උන්වහන්සේගේ උපදෙස් හා රැකවරණය යටතේ හැදී වැඩුණු මෙකුමරු දහසය හැවිරිදි වියේදී අලගක්කෝනාරයන් ඝාතනය කර ශ්‍රී පරාක්‍රමබාහු හෙවත් 6 වැනි පරාක්‍රමබාහු නමින් රජ විය.

මේ රජුගේ පියා ලෙසින් සැලකෙන 4 වැනි විජයබාහු රජු දඹදෙණියේ රාජ්‍යත්වයට පත් පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ වැඩිමහල් පුතණුවන් ය. මේ 4 වැනි විජයබාහු පිය රජුගෙන් අනතුරුව රාජ්‍යත්වයට පත්වූවෙකි. ක්‍රි. ව. 1270 දී පමණ ඔහු මියගිය බව පැවසේ. එසේ වුවද මේ රජු කිසි දිනක චීනයට අල්ලාගෙන ගිය බවක් කිසිදු තැනක සඳහන් වන්නේ නැත. ඒ අනුව පරාක්‍රමබාහු රජුගේ පියා විජයබාහු රජු ලෙසින් පිළිගැනීම නිවැරදි වන්නේ නැත.



6 වැනි පරාක්‍රමබාහු රජගේ පියා අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය පිළිබඳ වාර්තා සටහන් තබන තනතුරක් දැරුවකුගෙන් පැවත එන පරම්පරාවකට අයත් වූවෙකි. සූර්ය වංශිකයකු වූ ඔහු


4 පිටුවට

6 වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය සමය වසර 50 කට අධික ය. මේ කාල පරාසය තුළ සිදුවූ වැදගත් සිදුවීම් රැසක් පිළිබඳ සඳහන් වේ. ඒ ඇතැම්වා හේතුවෙන් මේ රජු ජාත්‍යන්තර කීර්තියට පවා පත්ව තිබේ.

මේ කියන කාලසීමාව වන විට දකුණු ඉන්දියාවේ බලයට පත්ව සිටි විජයනගර් අධිරාජයා 'කණ්ණාඩි රජු' ලෙසින් හැඳින්විණි. 'අලකේශ්වර යුද්ධය' හා 'රාජාවලිය' කෘතීන්ට අනුව කණ්ණාඩි රජු බල සෙ-නාවක් සමගින් නැව් නැඟ මෙරටට ගොඩබැස ඇත. පරාක්‍රමබාහු රජුගේ හමුදාවන් ඔවුන් හා යුද වැදී ජය ගත් පුවත සමස්ත ඉන්දියාව පුරාම පතළ විය.

'අදිවීරරාම සිද්ධිය' 6 වැනි පරාක්‍රමබාහු රජුගේ නාමය සුපතළ වූ තවත් පුවතකි. මේ රජුගේ වෙළෙඳ භාණ්ඩ පිරවූ නැවක් ඉන්දියාවේ අදිවීරරාම පටුනේදී රායන් මලවර් නමැත්තෙක් පැහැර ගත්තේය. එයින් කෝප වූ 6 වැනි පරාක්‍රමබාහු රජු නැව් සිය ගණනක-ින් යුත් හමුදාවක් යවා ඒ වෙළෙඳ තොටුපොළට පහර දී සොලී රටේ මකුඩන් කෝට්ටය ඇතුළු ප්‍රදේශ ගණනාවකින් අවුරුදු පතා බදු ලබාගත්තේය.

**නළුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**



# කෝට්ටේ ඓතිහාසික උරුම

**1949 දී පුරාවිද්‍යා දෙපාර්මේන්තුව විසින් මෙම ස්ථානයේ සිදුකර ඇති කැණීම්වලදී අඩි 97 × 58 × 5 1/2 ප්‍රමාණයේ සෘජුකෝණාස්‍රාකාර හැඩයට බඳින ලද විශාල වේදිකාවක් මත දැදිගම කොට වෙහෙර ස්වරූපයේ එකිනෙකට වෙනස් ස්තූප යුගළයක් හමුවී ඇත.**

**කබොක් ගලින් බඳින ලද විශාල ස්තූපයේ විශ්කම්භය අඩි 30 ක්ද කුඩා ස්තූපයේ විශ්කම්භය අඩි 24 ක්ද වේ. ස්තූප පේසාවන් 3 ක් සහිතව ඉදිකර ඇත. වේදිකාවට ප්‍රවේශ වීම සඳහා උතුරින් හා බටහිරින් කබොක් ගලින් තැනූ පියගැට පෙළ 2 කි.**

**මෙය පැරණි ආරාමයකැයි විශ්වාසයක් තිබේ. එහෙත් ආචාර්ය සෙනරත් පරණවිතානයන් පවසන්නේ මෙම ස්තූප 6 වැනි පැරකුම්බා රජුගේ හා සිය බිසව වූ රන්මැණිකා කුමරියගේ සොහොන් කොත් විය හැකි බවය.**

# වෙහෙරකන්ද නටබුන්





නළුන්

මාධ්‍ය කලාවට අභිමානවත් ස්වරූපයක් උරුම කරවූ

# ගුණදාස ලියනගේ




**[අප්‍රේල් 22 වැනි දිනට යෙදුණු සිය 94 වැනි ජන්ම දිනය නිමිත්තෙනි]**

අප රටේ පුවත්පත් කලාවේදීන්ගේ, පොත් පත් ලියන ලේඛකයින්ගේ ලැයිස්තුවක් සකස් කළහොත් එය ඉතාමත් දීර්ඝ වනවාට කිසිදු සැකයක් නැත. එසේ වුවද ඒ ක්ෂෙ‍ත්‍රයන් වෙත වඩාත් කීර්තිමත් මෙහෙවරක් ඉටුකළ, ඒ ක්ෂේත්‍රයන් තුළ සදා ගෞරවණීය චරිත බවට පත්වූ පුද්ගලයින් සිටියහොත් ඒ ඉතාමත් අතළොස්සකි. ඒ අතරින් කෝට්ටේ පුරවරයේ මිරිහාන ගම්පියස වාසභූමිය ලෙසින් තෝරා ගත් ගුණදාස ලියනගේ සූරීන්ගේ නාමය ඉහළින්ම ලියවේ.

1930 අප්‍රේල් 22 වැනි දින කළුතර බුලත්සිංහල දිවලකඩ අරඹෙගෙදරදී ඔහු උපන්නේ ලියනගේ දොන් මෙතියෙස් අප්පුහාමි - ලියනගේ දෝන කරෝනෝනා හාමිනේගේ බාල දරුවා ලෙසිනි. ඔහු මූලික අධ්‍යාපනය ලැබුයේ බෝතලේගම සිංහල මිශ්‍ර පාසලිනි. කුඩා කල පටන්ම ඔහු ඉංග්‍රීසි භාෂාව ඉගෙනගැනීමට අසීමිත උනන්දුවක් දැක්වීය. මීට තල්ලුවක් දුන් පියා ඔහු ඉංගිරියේ ඉංග්‍රීසි පාසල වූ ගාමිණි විද්‍යාලයට ඇතුළත් කළේය.

මේ කාලයේදී 'ඩේලි නිවුස්' පුවත්පත මිලට ගෙන අකුරක් නෑර කියවන්නට පුරුදු වී සිටි ගුණදාසයන් පසුව 'ටයිම්ස්' පත්‍රයේ පාඨකයෙක් බවට පත්විය.

ගාමිණී විද්‍යාලයෙන් සමුගත් ගුණදාසයන් රයිගම් පුරවරයේ කීර්තිමත් විදු පියසක් වූ හොරණ ශ්‍රීපාලි විදුහලට පිවිසුණේය. මේ කාලය තුළ කථිකයකු ලෙසත් ලේඛකයකු ලෙසත් කවියකු ලෙසත් පාසල තුළ නමක් දිනාගෙන සිටියේය.

'සිළුමිණ' හා 'ලංකාදීප' පුවත්පත් වෙනුවෙන් කවි ලියන්නට හුරු වූයේද මේ කාලයේදීය. ලංකාදීපයේ පළවූ ඔහුගේ මුල්ම ලිපිය වූයේ 'වැරදුණු ඉංගිරිසිය'යි. 'දිනමිණ'ටද ලිපි රචනා කළේය.

ශ්‍රීපාලියෙන් පළකෙරුණු 'නිවාස විත්ති' හා **Hostel Informer** පුවත්පත්වල ප්‍රධාන කතුවරයා වූයේද ගුණදාසයන්ය.

ඔහු 1951 දී පාසල් ජ්‍යේෂ්ඨ විභාගයට පෙනී සිටියේය. එහි ප්‍රතිඵල පිටවන තුරු නිකරුණේ කල් නොමැරූ ඔහු




ශ්‍රීපාලියේ ගුරුවරයක් ලෙස සේවය කළේය. ප්‍රතිඵල නිකුත් විය. ප්‍රථම පන්තියේ සාමර්ථයක් සමග විශිෂ්ට ප්‍රතිඵලයක් උරුම විය.

පුවත්පත් ලේඛනයෙන් නතර නොවූ ගුණදාසයන් ගුවන් විදුලිය වෙනුවෙන්ද නාට්‍ය රචනා කළේය. 'සුරබියෙල් අයියා' සිය කුළුඳුල් ගුවන් විදුලි නාට්‍යය විය. 1952 දී විකාශය වූ එහි නළුවකු ලෙසින්ද ඔහු තෝරා ගත්තේය. ගුණදාසයන් පුවත්පත් කලාවට අවතීර්ණ වූයේ 1953 දී 'ලංකාදීප' කර්තෘ මණ්ඩලයේ භාෂා පරිවර්තකයකු වශයෙනි. 1957 දී ඉන් ඉවත්ව ගල්ඔය සංවර්ධන මණ්ඩල කාර්යාලයේ සිංහල ප්‍රකාශන තනතුරට පත්විය.

අනතුරුව ගුණදාසයන් චීන ප්‍රවෘත්ති සේවයට සම්බන්ධ විය.

1959 දී හේ ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති අංශයේ වාර්තාකරුවෙක් ලෙස සේවයට එක්විය. ඒ හැරුණු විට 'ගුවන් විදුලි' සඟරාවේ සංස්කාරක ධුරයද ඉසිලීය.


ගුණදාසයන්ගේ විවාහය සිදුවූයේ මේ කාලයේදීය. ඒ, ශ්‍රීපාලියේ එකට උගත් චන්ද්‍රලතා නමැත්තිය සමගිනි. විවාහයෙන් අනතුරුව ගුවන් විදුලි සේවයට සමු දී ලීවර් සහෝදර සමාගමේ සඟරා සංස්කාරක වශයෙන් කටයුතු කළේය.

ඉන් ඉවත් වූ හේ ලංකාදීපයේ වාර්තාකරුවෙක් බවට පත්විය. ඒ සමගම 'සිංහල බෞද්ධයා' පුවත්පතේද වාර්තාකරුවෙක් ලෙසින් සේවය කර ඒ තනතුරේ ස්ථිර විය.

1965 දී 'දවස' පුවත්පතේ විශේෂාංග සංස්කාරකවරයා ලෙස සේවයට එක්විය. කෙටි කලක් 'රිවිදින' පුවත්පත වෙනුවෙන්ද සේවය කළේය. මේ කාලය තුළ පුවත්පත් ක්ෂේත්‍රය සම්බන්ධව අත්දැකීම් රැසක් උපයා සපයා ගත් ගුණදාසයන් 'රිවිරැස' පුවත්පතේ ප්‍රධාන කර්තෘ ධුරයට පත්විය. පසුව 'රිවිරැස' බවට පත්වූයේ 'රිවිදින' ය.

මෙකල මෙන්ම එකලද විවිධ 'අපත' චරිත පුම්බන උපහාර උත්සව ඕනෑ තරම් තිබුණේය. ගුණදාසයන් සහමුලින්ම වෙනස් ආකාරයේ උපහාර උළෙලක් පවත්වන්නට මුල් වූයේය. ඒ උළෙල නම්කෙරුණේ 'හොරණ ජොනී උපහාර උළෙල' ලෙසිනි. හේ තිස්පස් වසරක් හොරණ බස් නැවතුම් පොළේ අනුන්ගේ බර කර ගැසූ වයස්ගත වූවෙකි. 1972 ඔක්තෝබර් 26 වැනි දින පැවැති මේ උත්සවයට 'රිවිරැස' පත්‍රයේ මුල් පිටුවෙන් පුළුල් ප්‍රචාරයක් දුන්නේය.

මේ අතරවාරයේ ජර්මනියට ගොස් නැවත ලක්දිවට පා තබන විට පුවත්පත් ආයතනය හා රජය සමග වූ ගැටුමක් හේතුවෙන් 'දවස' පුවත්පතට මුද්‍රා තැබිණි. ඒත් සමග දරු පවුල්කරුවකු බවට පත්ව සිටි ගුණදාසයන්ට මුදල් අග හිඟකම් තදින්ම දැනෙන්නට පටන් ගත්තේය. 'සිංහ කොඩිය' සඟරාව එළිදුටුවේ මේ



කාලයේදීය. කාර්යාලය වුයේ මිරිහානේ සිය නිවසේ ගරාජයයි. මේ ප්‍රකාශනයට බලාපොරොත්තු නොවූ තරමේ යහපත් ප්‍රතිචාර ලැබුණේය.


මේ කාලය වන විට 'ලංකාදීප'ය අළෙවිය අතින් ඉතාමත් පහතට වැටී තිබුණේය. එය ගොඩ ගැනීමේ වගකීම පැවරුණේ ගුණදාසයන්ටය. 1975 දී ටයිම්ස් ආයතනයේ සියලුම ප්‍රකාශනවල ප්‍රධාන කර්තෘවරයා ලෙසින් වගකීම් භාරගත්තේය. ඒ වෙනුවෙන් උපරිමව කැප වූ හේ 1977 දී ඒ වගකීමෙන් නිදහස් විය.


'ඒෂියාවීක්' සඟරාවේ කොළඹ වාර්තාකරු ලෙසින්ද කලක් කටයුතු කරමින් සිට පාර්ලිමේන්තුවේ කතා පරිවර්තකයකු ලෙස කුළී පදනම මත සේවය කළේය.

අනතුරුව මහජන බැංකුව විසින් පළකරන ලද 'කල්පනා' මාසික සඟරාවේ (මෙය මෙරට බැංකුවක් විසින් පළ කෙරුණු මුල්ම සඟරාව විය) කතුවරයා ලෙසින් වාර සඟරා ඉතිහාසයේ විශාල පෙරළියක් කළේය.

1984 දී ගුණදාසයන් එවකට අපට ආධුනික මාධ්‍යයක් වූ රූපවාහිනියට සම්බන්ධ වී 1987 දී මාධ්‍ය ක්ෂේත්‍රයෙන් ඉවත් වූයේය.

පුවත්පත් කිහිපයක කර්තෘ ධුරය දරමින්ද අන්තර්ජාතික සඟරාවල ශ්‍රී ලංකා වාර්තාකාර ධුරය දරමින්ද ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍යයන්ට සම්බන්ධ වෙමින්ද තමන්ට හපන්කම් රැසක් කිරීමට හැකි වූ බව 'දිවලකඩ ගුණදාස' නමින් ලියූ තම ජීවිත කතාවෙන් ගුණදාසයන් පවසයි.ග්‍රන්ථ කතුවරයකු වශයෙන් ඔහුගෙන් ඉටුවූයේ ප්‍රශංසාත්මක මෙහෙවරකි. 'ඩී. බී. ධනපාල චරිතාපදානය', 'දෙල් ගහ යට විප්ලවය' (ආචාර්ය ඒ. ටී. ආරියරත්න චරිතාපදානය),




'තෙවැනි සිල්පදය නොකඩමි', 'දෝන කමලාවතී', 'මල්ලිගෙ විත්ති', 'බැද්දට මල් වරුසා', 'කැලෑ පැංචා', 'බයිසි මොටෝ එක', 'මුලු හදින් මම ඇයට පෙම් කොට' ඉන් කිහිපයකි. මේ ඇතැම්වා ඉතාමත් විවාදාත්මක විය. මෙලෙස හේ සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පොත් 50 කට වඩා රචනා කළේය.

මේ අතරින් පුවත්පත් ලේඛකයකු ලෙසින් ස්වකීය නාමය සුපතළ වූ කෘතිය 'පුවත්පත් මෙල්ල කිරීම' ය. මෙමගින් පුවත්පත් කලාව සම්බන්ධ වාරණයන් හා ස්වයං වාරණයන් පිළිබඳ මනා හෙළිදරව්වක් කොට තිබේ.

ගුණදාසයන් කිසි දිනක රටේ පාලකයින්ගේත් පුවත්පත් ආයතන හිමිකරුවන්ගේත් රූකඩයක් නොවූ ලේඛකයෙකි, මාධ්‍යකරුවෙකි. හෙතෙම තම මතය නිර්භයව, නිර්ලොභීව පළ කළේය. තමන් විශ්වාස කළ, ගරු කළ සාධාරණත්වය වෙනුවෙන් පෑන හැසිරවූයේය. ඒ හේතුවෙන් ඔහුට අත්වූ අලාභ, චිල්ල වූ තර්ජන ගර්ජන ආදියේද නිමක් නොවීය. නමුත් ඒ කිසිවක් අභිමුව වුව තමා අගය කළ ස්ථාවරය අකුරකින් හෝ වෙනස් නොකළ අභිමානීය වූ මාධ්‍යකරුවෙකි.

ශ්‍රීමත්, වජිරපානී, චේතනා දුවා දරුවන් පියාගේ පියවර අනුව යමින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන්හි පෙරළිකාර මෙහෙවරක නියැළෙමින් සිටිති.

1998 මාර්තු 12 වැනි දින හෙතෙම දිවි ගමන නිමා කළේ පිටකොන්ද කෙළින් තබාගෙන මාධ්‍ය මෙහෙවරේ යෙදිය හැකි බව ක්‍රියාවෙන් ඔප්පු කළ මාවතක් විවර කරමිනි.

**නළුන්**




# නුගේගොඩ මහජන පුස්තකාලය

**විශේෂ ස්තූතිය**

**නුගේගොඩ මහජන පුස්තකාලයාධිපති එම්. එස්. එන්. පෙරේරා**

නුගේගොඩ මහජන පුස්තකාලය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින් පාලනය වන මහජන පුස්කතාල හතරෙන් එකකි. 1977 ජූලි මස 01 වැනි දින ආරම්භ කරන ලද මේ පුස්තකාලය නුගේගොඩ පරණ කැස්බෑව පාරේ වැපල් පටුමගේ පිහිටුවා ඇත.

පළමුවැනි ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු යටතේ පාලනය වන, 14 දෙනකුගෙන් යුක්ත කාර්ය මණ්ඩලයක් විසින් පාඨකයින්හට ප්‍රශස්ත මට්ටමේ සේවාවක් ලබාදීමට නුගෙගොඩ මහජන පුස්තකාලය සමත් වී තිබේ. දැනට මෙහි දහසකට අධික සක්‍රිය සාමාජික සාමාජිකාවන් පිරිසක් සිටීමෙන් මේ කාරණාව මැනවින් පැහැදිලි වේ. මේ වනවිට මෙය සතුව පොත් පත් 43,000 ක් පමණ තිබේ.

ළමා අංශය, බැහැර දෙන අංශය, අධ්‍යයන අංහය, විමර්ශන අංශය හා පුවත්පත් සහ වාර ප්‍රකාශන අංශය යන අංගවලින් මේ පුස්තකාලය සමන්විත වේ.



ළමා මනසට ගෝචර වන. විවිධ විෂයයන් හා තේමාවන් යටතේ ලියවුණු හරවත්, දුලබ පොත් පත් රැසකින් මෙහි ළමා අංශය සමන්විත වේ. මෙහි සාමාජිකත්වය හිමි දූ දරුවන් උදෙසා රොබෝ තාක්ෂණික වැඩමුළු, චිත්‍ර හා අත්කම් වැඩමුළු රැසක් පවත්වා ඇත. ඔවුන් තුළ ආධ්‍යාත්මික දියුණුවක් ගොඩනැංවීමේ අටියෙන් ආගමික වැඩසටහන්ද ක්‍රියාවට නැංවේ.

බැහැර දෙන අංශයට හිමි පොත් රැස අතර කුමාරතුංග මුනිදාස, මාර්ටින් වික්‍රමසිංහ, ඩබ්ලිව්. ඒ. සිල්වා, ජී. බී. සෙනානායක, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර යන සම්භාවනීය ලේඛකයින් විසින් නිර්මිත පොත් එකතුව වඩාත් කැපී පෙනේ. මේ අංශය විසින් ගෘහාශ්‍රිත අලංකරණ පැළෑටි එකතුවක්ද පවත්වාගෙන යයි. ඒ පැළෑටි රෝපණය කරන ආකාරය සම්බන්ධව දැනුම හා උපදෙස් ලබාදීමක්ද සිදුකෙරේ.

මේ පුස්තකාලයේ අධ්‍යයන අංශය පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර එකතුවක්ද පවත්වාගෙන යයි. ඒවා මගින් දූ දරුවන්හට අධ්‍යාපන කටයුතුවල යෙදීමේ පහසුකම් සලසා තිබේ. මේ අංශයට පැමිණ අධ්‍යයන කටයුතුවල යෙදෙන සිසුනට විෂය කරුණු සාකච්ඡා කිරීමේ පහසුකම් සපයා තිබීම විශේෂත්වයකි.

මෙහි විමර්ශන අංශය පෙර සඳහන් කළ ලේඛකයින් විසින් රචිත පොත් එකතුවකින්ද මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ කෘති එකතුවකින්ද නීතිය හදාරන්නන්හට වැදගත් වන පොත් 1000 ක පමණ එකතුවකින්ද කෝට්ටේ යුගය සම්බන්ධව ලියවුණු පොත් එකතුවකින්ද පරිසරය තේමා කොටගත් පොත් එකතුවකින්ද සම්පූර්ණ ත්‍රිපිටක පොත් එකතුවකින්ද **Britanica** විශ්වකෝෂ පොත් එකතුවකින්ද පොහොසත්ය.

පුවත්පත් සහ වාර සඟරා අංශය වෙතින් දිනපතා පුවත්පත් 09 ක්, ඉරිදා පුවත්පත් 09ක්, සති අග පුවත්පත් 02 ක් සහ කියවීමේ පහසුව සලසා තිබේ. මේ අංශයට අනුබද්ධව පවත්වාගෙන යන ප්‍රජා තොරතුරු ඒකකය මගින් පාඨක ප්‍රජාවට විවිධ තොරතුරු සහ දත්ත ලබාගැනීමේ පහසුව සලසා ඇත.

නුගේගොඩ මහජන පුස්තකාලය සිය සිය පාඨක ප්‍රජාව උදෙසා ප්‍රදානය කර ඇති සුවිශේෂත්වයන් කිහිපයක් සම්බන්ධවද මෙහිලා සිහිපත් කළ යුතු වන්නේය. අන්ධභාවයෙන් යුත් පාඨකයින් උදෙසා මේ පුස්තකාලයේ බ්‍රේල් සඟරා එකතුවක් පවත්වාගෙන යයි.

මෙහි වූ 'වැඩිහිටි කවුළුව' මගින් පුස්තකාලයේ තරප්පු පේළිය නැඟීමට අපහසු පාඨකයින් වෙනුවෙන් පොත් නිකුත් කෙරේ. කවද ආබාධිත පාඨකයින් සඳහා සුවිශේෂ ප්‍රවේශ පහසුකම්ද සලසා තිබීම විශේෂයෙන් අවධාරණය කළයුතු කරුණකි. **Leisure reading corner/Elder corner** හිදී විවිධ පුද්ගලයින් විසින් පරිත්‍යාග කරනු ලැබ ඇති පොත් පත් තෝරාගෙන සුවපහසුව අසුන් ගෙන විවේකීව කියවා නැවත



9 පිටුවට

8 වැනි පිටුවෙන්...

භාරදීමේ පහසුකම් සලසා ඇති කවුළුවකි. මේ පුස්තකාලය මගින් පවත්වගෙන යන පුවත්පත් ලිපි එකතුවද විශේෂයෙන් සිහිපත් කළයුතුය. ඉතා ක්‍රමානුකූලව පවත්වාගෙන යන මෙමගින් විවිධ විෂයයන් පිළිබඳ කාලීන වශයෙන් වැදගත් වන තොරතුරු රැසක් උකහාගත හැකි වන්නේය. නුගෙගොඩ මහජන පුස්තකාලය පාඨකයින්හට පොත් කියවීමෙන් ලබන දැනුමෙන් ඔබ්බට යමින් ඔවුන් තුළ බුද්ධි ප්‍රබෝධය ඉහළ නැංවීම හා වින්දනීය සජීවී මානසික උත්තේජනයක් ඇතිකරලීම උදෙසා ක්‍රියාවට නංවා ඇති වැඩසටහන් කිහිපයකි. 'මානව පුස්තකාලය' **(Human library)** වැඩසටහන හා 'විද්වතකු පොතක් බවට පත්කර ඔහු හෝ ඇය සමගින් කෙරෙන සංවාද' ඒ අතරින් ප්‍රමුඛ වේ.

මේ පුස්තකාලය අරඹා වසර 46 ක් සපිරීම නිමිති කොටගෙන 2023 වසරේ දෙසැම්බර් 28 වැනි දින පැවැත්වූ සර්ව රාත්‍රික පිරිත් පින්කම හා පසුදින පැවැති සාංඝික දාන පින්කම ඉතාමත් ඉහළ මට්ටමෙන් සංවිධානය වූවකි.

නුගේගොඩ මහජන පුස්තකාලය වැදගත් වනුයේ හුදෙක් දැනුම තිළිණ කෙරෙන මධ්‍යස්ථානයක් ලෙසින් පමණක් නොවන්නේය. එමගින් ඉටුවන සමාජ සද්කාර්යයන්ද රැසකි. ඒ අතර වාර්ෂිකව සංවිධානය කෙරෙන මහරගම අපේක්ෂා රෝහල උදෙසා පරිත්‍යාග කෙරෙන ලේ දන්දීමේ වැඩසටහන බෙහෙවින් අගය කළ යුතුය.

කීර්තිමත් ඉතිහාසයක් උරුම නුගේගොඩ මහජන පුස්තකාලය මගින් පාඨක ප්‍රජාව වෙත සැලසෙන මෙකී නොකී සේවාවන් වඩාත් සාර්ථකව හා ඵලදායකව ඉටුකිරීමට එහි කාර්ය මණ්ඩලයෙන් රාජකාරි මට්ටම ඉක්මවා ලැබෙන සහයෝගය හා ඉතාමත් සක්‍රිය මට්ටමෙන් ක්‍රියාත්මක වන පාඨක සමාජයෙන් ලැබෙන්නා වූ සුහද දායකත්වය පිළිබඳ එහි පුස්තකාලයාධිපති නිර්මිත පෙරේරා මහතා ඉතාමත් ප්‍රශංසාත්මකව සිහිපත් කර සිටියි.

මේ පුස්තකාලය වෙනුවෙන් සිය පොත් පත් පරිත්‍යාග කිරීමට කැමැත්තක් දක්වන උත්තමයින් වෙතින් පුස්තකාලයේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ඒවා භාරගැනීමටද නුගෙගොඩ මහජන පුස්තකාලය සූදානම්ව සිටියි. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නන්හට 0112 853 638 යන දුරකථන අංකයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීමට පුළුවන.

නුගේගොඩ මහජන පුස්තකාලය පොහොය දිනවල, ප්‍රසිද්ධ නිවාඩු දිනවල හා සිකුරාදා දිනවල හැර සෑම දිනකම පෙරවරු 8.30 සිට පස්වරු 5.15 දක්වා දැනුම හා අත්දැකීම් සොයා යන ඔබ වෙනුවෙන් හෘදයාංගම වූද කාර්යක්ෂම වූද අර්ථවත් වූද සේවාවක් සැලසීම වෙනුවෙන් නිරතුරුව ඇප කැපව සිටියි.

**අනුර යහම්පත්**

## අප පුස්තකාලයන්හි ඇති සම්මානලාභී කෘති කිහිපයක්







# කෝට්ටේ අගනගරයේ සුන්දරබව හා නිරෝගීබව සුරකින
# නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව





**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව ප්‍රධාන අංශ කිහිපයකින් සමන්විත වේ. ඒ අතරින් නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රධාන තැනක් ගනියි. අගනගරය පවිත්‍රව, අලංකාරව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා මෙයින් ඉටුවන සේවාවන් අතිමහත්ය.**

**මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටුවන සේවාවෙන් මේ ආකාරයෙන් සාරාංශගත කළ හැකි වන්නේය.**




- කසළ කළමනාකරණය
- කාණු පිරිසිදු කිරීම
- ඩෙංගු මර්දන කටයුතු ඉටුකිරීම
- මදුරු මර්දන කටයුතු ඉටුකිරීම
- සෞඛ්‍ය සායන පැවැත්වීම
- ගලී රථ සේවාව පවත්වාගෙන යාම
- ප්ලාස්ටික් ප්‍රතිචක්‍රියකරණ සඳහා දායක වීම
- ආහාර පනත අනුව ආපන ශාලා පරීක්ෂාව සිදුකිරීම
- මහජනතාවට හිතකර සහ සෞඛ්‍යාරක්ෂිත සේවාවන් සපයන ආයතන සඳහා වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම
- පරිසර නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කරන කර්මාන්ත ශාලා සහ අනෙකුත් නිෂ්පාදන ආයතන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම
- ආපන ශාලා හා ආහාර නිෂ්පාදන ආයතන පවත්වාගෙන යන්නන් සඳහා ආහාර පනත පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

නාගරික සෞඛ්‍ය දෙපාර්මේන්තුව තම ප්‍රමුඛ වගකීමක් ලෙසින් කසළ කළමනාකරණය ඉතාමත් ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාවට නංවා තිබේ.

කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ නිවාස 39047 ක්ද ව්‍යාපාරික ස්ථාන 6310 ක්ද රාජ්‍ය ආයතන 193 ක්ද පිහිටා ඇත. දෛනිකව මේවායේ එක්රැස් වන කසළ ප්‍රමාණය අතිමහත්ය. මේවා නිසි පරිදි එක්රැස් කර කළමනාකරණය අත්‍යවශ්‍ය කටයුත්තකි.

මේ කාර්යය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවට තනිව කළ හැකි කාර්යයක් නොවන්නේය. එබැවින් කසළ කළමනාකරණ සේවා කටයුතුවල පහසුව සලසා කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම

නිලධාරී වසම් 21 ක් යටතේ පාලන කොට්ඨාස 10 ක් පවත්වාගනිමින් මහා නගර සභා සේවා දායකත්වයෙන් හා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් කසළ කළමනාකරණය සිදුකෙරේ.



ඒ අනුව 514 ඒ වැලිකඩ බටහිර, 514 බී රාජගිරිය, 514 සී ඔබේසේකරපුර, 514 ඩී වැලිකඩ උතුර, 520 නාවල බටහිර, 520 ඒ කොස්වත්ත, 520 බී නාවල නැගෙනහිර, 521 ඇතුල්කෝට්ටේ, 521 ඒ ඇතුල්කෝට්ටේ බටහිර යන ග්‍රාම නිලධාරී වසම්වල කසළ කළමනාකරණය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් සිදුකෙරේ.

519 නුගේගොඩ, 519 ඒ පාගොඩ, 519 බී නුගේගොඩ බටහිර, 519 සී පාගොඩ නැගෙනහිර, 522 පිටකෝට්ටේ බටහිර, 522 ඒ පිටකෝට්ටේ නැගෙනහිර, 522 බී පිටකෝට්ටේ, 526 ගංගොඩවිල උතුර, 526 ඒ ගංගොඩවිල දකුණ, 526 සී ගංගොඩවිල නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම්වල කසළ කළමනාකරණය පෞද්ගලික අංශයක් විසින් සිදුකෙරේ.

මෙහිදී දිරන හා නොදිරන වශයෙන් කසළ වෙන් කර ලබාගැනීම සිදුකෙරේ. මෙම කටයුත්ත දිනපතාම ක්‍රමානුකූල අධීක්ෂණයක් යටතේ සිදුකෙරේ. (නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ඉටු වන සෙසු සේවාවන් පිළිබඳ ලබන කලාපයේ පළවන ඊළඟ ලිපියෙන් විස්තර කරන්නෙමු.)

**තිළිණ සම්පත්**





**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ**

# ගලි රථ සේවාව

ඔබ වෙනුවෙන් සූදානම්. වැඩි විස්තර සඳහා අපගේ පහත සඳහන් දුරකථන අංකයට අමතා

**0112 874 701 / 0112 874 702**

**අපගේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමුකරවා ගන්න**

# නිවාස හෝ මහල් ගොඩනැගිලි සැලැස්මක් මහා නගර සභාවක් මගින් අනුමත කරගන්නේ මෙසේය



**පළමුවෙන්ම නිවාස සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ සංවර්ධන නියෝග/රෙගුලාසිවලට අනුකූල වන පරිද්දෙන් නිවාස හෝ ගොඩනැගිලි සැලසුම් සකස් කරගත යුතුය.**

**අනතුරුව මහා නගර සභාව මගින් ලබාගත යුතු ගොඩනැගිලි සැලසුම් අනුමත කරවාගැනීම සඳහා වන අයදුම් පත්‍රය නිවැරදිව පුරවා ඒ සමග ඉල්ලා ඇති සියලුම ලේඛනද සමග මහා නගර සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.**

**මේ සඳහා අවශ්‍ය වන ලේඛන හා විමසන තොරතුරු පිළිබඳඔබ දැන සිටීම ඉතාමත් වැදගත් වේ. ඒ ලේඛන මොනවාද යන්න ගොඩනැගිලි අයදුම් පත්‍රයේ (Building application) පැහැදිළිව සඳහන් කර තිබේ.**

**● අයදුම්කරුගේ/අයදුම්කරුවන්ගේ විස්තර**

මේ යටතේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, ෆැක්ස් අංකය, තැපැල් ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය, වාස්තු විද්‍යාඥයාගේ/නගර නිර්මාණ ශිල්පියාගේ නම, සැලසුම් ශිල්පියාගේ නම, ඉංජිනේරුවරයාගේ නම, අයදුම්කරුගේ අත්සන, අයදුම් කරන දිනය ආදී තොරතුරු දැක්විය යුතුය.

**● යෝජිත සංවර්ධන සැලසුම පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්**

මේ යටතේ සංවර්ධන කටයුත්තේ වර්ගය (නව ඉදිකිරීමක්ද, නැවත ඉදිකිරීමක්ද, සංශෝධනයක්ද, වෙනස් කිරීමක්ද, යන තොරතුරු), වරිපනම් අංකය, පාරේ නම, තැපැල් කලාප අංකය, පළාත් පාලන ආයතනයේ නම, ඉඩමේ අයිතිය (සින්නක්කර, බදු, කුලී. වෙනත් ආදී වශයෙන්), යෝජිත ගොඩනැගිලි භාවිතයන් (නේවාසික, සිල්ලර වෙළෙඳාම, රජයේ කාර්යාල, වෙනත් කාර්යාල, ආපන ශාලා, හෝටල්, කර්මාන්ත වැඩපොළ, ගුදම්, වෙනත් ආදිය යන්න දැක්විය යුතුය), ආදිය සම්බන්ධව තොරතුරු දැක්විය යුතුය.

**● අයදුම්කරු ඉඩමේ හිමිකරු නොවන්නේ නම් ඉදිරිපත් කළ යුතු විස්තර (අවශ්‍ය වන්නේ නම් පමණි)**

ඉඩම් හිමිකරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, ෆැක්ස් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, තැපැල් ලිපිනය, ඉඩම් හිමිකරුගේ ප්‍රකාශය ආදිය දැක්විය යුතු වන්නේය.

**● පිරිවිතර**

අදාළ වේ නම් පමණක් වරිපනම් බදු ගෙවා ඇති සහතිකය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ලබාගන්නා ලද ජල නිශ්කාෂණය, යොමු අංකය, පළාත් පාලන ආයතනයේ ජල සම්පාදන හා ජලාපවහන අංශය මගින් ලබාගත් ජලාපවහන නිශ්කාෂණය. නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් මූලික සැලසුම් නිශ්කාෂණය, පාර්ලිමේන්තු ආරක්ෂක කලාප නිශ්කාෂණය, මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කළ නිශ්කාෂණය (පාරිසරික සංවේදී



13පිටුවට

කලාපයකට අයත් නම් හෝ දූෂ්‍ය කර්මාන්ත ගණයට අයත් වේ නම් පමණක්), ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිශ්කාෂණය (ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනය මගින් හඳුනාගන්නා ලද ආපදා කලාපයක පිහිටයි නම්), ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබා තිබේද යන්න, දැනට භාවිතය, යෝජිත භාවිතය, සංවර්ධන කලාපය, ප්‍රවේශය, මාර්ග අයිතිය, අනුබෙදුම් සැලසුම් අනුමතද යන වග, අනුමත සැලසුමක් නම් යොමු අංකය හා දිනය, එසේ නැත්නම් මිනින්දෝරු සැලැස්මේ විස්තර (සැලසුම් අංකය, මිනින්දෝරු නැන, ස්ථානයේ වපසරිය, ගෙබිම වීථි රේඛාවට හෝ වෙනත් රක්ෂිතයකට අයත්ද යන වග, ගොඩනැගිල්ලෙන් ආවරණය වන ඉඩ ප්‍රමාණය, මායිම්වලට ඇති දුර ප්‍රමාණයන්, ගොඩනැගිල්ලේ උස, මහල් ගණන ආදිය) සඳහන් කළ යුතුය.

- **ගොඩනැගිල්ලේ මහල්වල වර්ග ප්‍රමාණය**
- **නිදන කාමර, මුලුතැන්ගෙවල්, වැසිකිළි, තරප්පු පෙළ, ගබඩා කාමර ආදියේ විස්තර**
- **සංවර්ධනයේ විස්තර**


මේ යටතේ ගොඩනැගිල්ලෙන් ආවරණය වන ප්‍රමාණය, යෝජිත ගොඩනැගිල්ලේ භාවිතය, භූමියේ වර්ග ප්‍රමාණය ආදිය දැක්විය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි අදාළ වූ ලේඛනද සමග නිවැරදිව භාර දෙන ලද ගොඩනැගිලි සැලසුම් අනුමත කරගැනීම සඳහා ගතවන කාලය සාමාන්‍යයෙන් සති 4 ක් පමණ වේ.

මේ සඳහා අවශ්‍ය වැඩිදුර විස්තර **kotte.mc.gov.lk** යන වෙබ් අඩවියෙන් බාගත **(Download)** කරගත හැකි වේ.

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ කළමනාකරණ කමිටුව**

**මෙම කෘතීන් පාඨක ඔබට අපගේ රාජගිරිය, නුගේගොඩ, උඩහමුල්ල, බැද්දගාන යන මහජන පුස්තකාලවලින් ලබාගත හැකිය**



## මේ සිංහල දෙමළ අලුත් අවුරුද්දේ



# සිතුවිලිවලින් අලුත් වෙමු



සිත් තුළ සතුට, සැනසුම, සමගිය වර්ධනය වන තවත් සිංහල හා දෙමළ අලුත් අවුරුද්දක් උදා විය. දෙමාපිය දූදරු සබඳතාව වඩාත් සෞන්දර්යාත්මක කරවන, අසල්වැසි ප්‍රජාවන් සමග වඩාත් සමීප වන කාලයක් ලෙසින් මෙම කාලය සලකන්නට පුළුවන.

දෙමාපිය වැඩිහිටි ආශිර්වාදය ලබාගැනීම, තෑගි බෝග හුවමාරු කරගැනීම, ක්‍රීඩාවන්හි නිරත වීම වැනි කාරණාවන් තුළින් සෙනොහඹර වූත් වින්දනීය වූත් තවත් කාලයක් නැති තරම්ය. සිත් තුළ ඉස්මතු වන පහන් හැඟීම් තව තවත් තීව්‍ර කරවන අන්දමින් මේ සෞභාග්‍යවන්ත කාලය තුළ පරිසරය තුළින්ද දැකිය හැක්කේ අතිශය වූ විචිත්‍රවත් බවකි.



වැඩිහිටි අයට තමන් පසුගිය වසරේ ජීවිත ගත කළ ආකාරය පිළිබඳවත් එම කාලය තුළ තමන්හට සපුරා ගත නොහැකි වූ ඉලක්කයන් පිළිබඳවත් එම ඉලක්කයන් සපුරාගැනීමට නොහැකි වූ හේතු කාරණා පිළිබඳවත් එවන් අඩු පාඩු දුරු කරගෙන ඉදිරි ජීවිතය සාර්ථකව ගත කළ යුතු ආකාරය පිළිබඳවත් සැලසුම්සහගතව සිතීමට මෙය වඩාත් සුදුසු කාලය යැයි හැඟේ.

ඉගෙනීමේ යෙදෙන දුවා දරුවන්ටද පසුගිය වසරේ අධ්‍යාපනික වශයෙන් තමන්හට මගහැරුණු ඉලක්කයන් පිළිබඳවත් ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වීමට බලපෑ හේතු පිළිබඳවත් ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු වැඩපිළිවෙළක් සැලසම් කරගැනීම පිළිබඳවත් සිතා බලන්නට මෙය වඩාත් සුදුසු කාලය යැයි හැඟේ.

මෙය සතුට, විනෝදය උතුරා යන කාලයකි. එයට හේතුව පවුල්වල සාමාජික පිරිස් එක්රැස්ව විවිධ ක්‍රීඩාවල නිරත වීමෙන් හා කණ්ඩායම් වශයෙන් ඒකරාශි වි අවුරුදු උත්සව පැවැත්වීමෙනි. මේ ලෙසින් ලබන සෞන්දර්යාත්මක අත්දැකීම් මගින් එකිනෙකා අතර සුහදතාව වර්ධනය වීම, සාමුහික බව ඇතිවීම, ජය පරාජය සතුටින් යුතුව විඳ දරාගැනීමට හුරු වීම වැනි අගනා අත්දැකීම් අපගේ ජීවිතවලට ළඟා කර ගත හැකි වනු ඇත.

අලුත් අවුරුදු චාරිත්‍ර අතරට පැළ රෝපණය වෙනුවෙන් නැකතක් වෙන් කර තිබීම විශේෂයෙන් අගය කළ යුතුය. අද එළවළු, පළතුරු, මිරිස්, තුනපහ ගිනි ගණන්ය. එවන් පීඩාකාරී වාතාවරණයක් තුළ අඩුම තරමින් මිරිස් පැළයක්, දෙහි පැළයක්, කරපිංචා පැළයක් මේ නැකතට සිටුවා රැක බලාගැනීම කෑම බීම වෙනුවෙන් අද වැය කරගැනීමට සිදුවී ඇති මහා වියදම යම් තරමකින් අඩු කර ගැනීමට හෙතුවක් වනු ඇත.


අලුත් අවුරුද්ද හුදෙක් උත්සවයකට පමණක් සීමා නොකරගෙන එයින් අපට ළඟා කරගත හැකි ඉහත කී ජීවිතාදර්ශයන් තුළින් අපගේ ජීවිත අලෝකවත් කරගැනීම තුළින් මෙම උළෙල සාර්ථකව සැමරූ බවට උදම් අනන්නට පුළුවන් විය යුතුය.

අලුත් අවුරුද්දේදී ඔබ අප මම යන කොයි කවුරුත් කරන්නේ අලුත් ඇඳුම් ඇඳ ගතින් අලුත් වීමය. ඒ වෙනුවට අලුත් අවුරුද්දේ අලුත් සිතුවිලිවලින් සිතින් අලුත් වන්නට අපි අධිෂ්ඨාන කර ගනිමු.

**නළුන්**

## නීතියයි ඔබයි

# අන්තිම කැමති පත්‍රයක් නොතබා අවිවාහකව මියගිය කෙනෙකුගේ දේපළට කුමක් වේද?





මියගිය කෙනකුගේ දේපළවලට වන්නේ කුමක්ද? යන්න බොහෝ දෙනකුට ඇති ගැටලුවකි. මේ කාරණාව හැඳින්වෙන්නේ 'දේපළ උරුම වීම' නමිනි. මේ පිළිබඳ සාකච්ඡා කිරීමේදී ප්‍රධාන වශයෙන් අවබෝධ කරගත යුතු කාරණාවක් තිබේ. ඒ, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති ක්‍රමය ගැනය.

ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය මිශ්‍ර නීති ක්‍රමයක් ලෙසින් හැඳින්වේ. එයට හේතුව අප රටේ සෑම දෙනාටම බලපාන පොදු නීතියක් පවතින නිසාය. ඒ හැරුණු විට මුස්ලිම් ජාතිකයන්ට බලපාන මුස්ලිම් නීතියත් උඩරට පළාතේ සිංහල ජනයාට බලපාන උඩරට නීතියත් යාපනය ප්‍රදේශයේ දෙමළ ජනයාට බලපාන තේසවලාමේ නීතියත් තිබේ.

මියගිය කෙනකුගේ දේපළවලට කුමක් වන්නේද? යන කාරණාව සලකා බලද්දී මේ පොදු නීතියත් උඩරට නීතියත් තේසවලාමේ නීතියත් යනාදී සෑම කාරණාවක්ම පිළිබඳ සලකා බැලිය යුතුය. මේ ලිපියෙන් සාකච්ඡා කෙරෙනුයේ පොදු නීතිය යටතේ එසේත් නැත්නම් සාමාන්‍ය නීතිය යටතේ ජීවත්වන කෙනකු මියගියාට පසුව ඔහුගේ දේපළවලට කුමක් සිදුවන්නේද? යන කාරණාව ගැනය.

මේ කාරණාව ගැන කතා කිරීමේදී ඊළඟට සැලකිලිමත් විය යුතු වන්නේ යම් පුද්ගලයකු මියයාමට පෙර තමන්ගේ දේපළ උරුම වීම සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රයක් සකස් කර තිබේද? නැත්ද? යන කාරණාවය. කෙනකු මියයාමට පෙර අන්තිම කැමති පත්‍රයක් සකසා තිබේ නම් ඒ කටයුත්ත සිදුවන්නේ වෙනත් ආකාරයකටය. ඒ පිළිබඳ ඉදිරියේදී වෙනත් ලිපියකින් කරුණු සාකච්ඡා කරමු.

මේ ලිපියෙන් මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය කෙනකුගේ දේපළ උරුම වීම සම්බන්ධයෙනි.

මේ ගැන සැලකිලිමත් වීමේදී ප්‍රධාන වශයෙන් බලපාන මෙරට නීතිමය ප්‍රතිපාදනය වන්නේ 1876 අංක 15 දරන 'වෛවාහක අයිතීන් සහ උරුම ආඥා පනත' වේ. කෙනකුගේ දේපළ උරුම වීම සම්බන්ධයෙන් තීරණය කරනු ලබන්නේ මෙකී නීති ප්‍රතිපාදනයේ කරුණු සඳහන් වන ආකාරයටය.

මෙහිදී අප ඊළඟට සැලකිලිමත් විය යුතු කාරණය වන්නේ කෙනකු මියයන විට ඔහු/ඇය විවාහකව සිටියේද? නැත්ද? යන කාරණාවය.

කෙනෙක් අවිවාහකව සිටියදී මියගියහොත් ඒ දේපළ උරුම වන්නේ ඔහුගේ/ඇයගේ දෙමව්පියන්ටය. කෙනකු මියගිය විට ඔහු/ඇය අවිවාහක නම් ඒ දේපළින් හරි අඩක් පියාටද හරි අඩක් මවටද අයිති වන්නේය.

කෙනකු අවිවාහකව මියගියා යැයි සිතමු. ඔහුගේ/ඇයගේ මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් අයකු පමණක් ජීවතුන් අතර සිටිනවායැයිද සිතමු. එවිට අවිවාහකව සිට මියගිය අයගේ මවට/පියාට ඒ දේපළවලින් භාගයක් උරුම වේ. ඉතිරි භාගය දේපළවල උරුමකරුගේ සහෝදර සහෝදරියන් අතර සමානව බෙදී යයි.

අවිවාහකව සිට කෙනකු මියයන විට ඔහුගේ/ඇයගේ දෙමව්පියන් ජීවතුන් අතර නැත්නම් ඒ දේපළ ඔහුගේ/ඇයගේ සහෝදර සහෝදරියන් හා අනෙකුත් උරුමකරුවන් අතර සමානව බෙදී යයි.



උපදෙස්
නීතිඥ චානක අබේවික්‍රම මහතා

ශ්‍රී පුර පුවත්

## කෝට්ටේ අග නගරයේ යහපතට ක්‍රියාමාර්ග රැසක්

මේ වසරේ ප්‍රථම කෝට්ටේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම එහි සභාපති කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී රැස්විය. මෙහිදී කෝට්ටේ ප්‍රදේශයට බලපාන කාරණා රැසක් පිළිබඳ සාකච්ඡාවට බඳුන් කෙරිණි.

කෝට්ටේ අග නගරයට බලපාන විධිමත් නාගරික සැලැස්මක් සකස් කිරීම, අඹතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම, බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය මගින් භූගත ජල නළ එළීම නිසා උද්ගත වන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම, කෝට්ටේ සංචාරක ආකර්ෂණයක් සහිත තෙත් බිම් උද්‍යානයක් ඉදිකිරීම, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සඳහා වන සංචාරක ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සාකච්ඡා කිරීම, කොට්ඨාසය තුළ ඩෙංගු රෝග මර්දනය සහ රෝග පාලනය පිළිබඳ සාකච්ඡා කිරීම, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමග ඒකාබද්ධව ඉඩම් පවරා දීම, සිරිමොර උයන නානායක්කාර මාවතේ පිහිටි හීන් ඇළ අවට නිවාස සඳහා ඔප්පු ලබාදීම ආදිය ඒ අතර විය.

මෙම රැස්වීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කසුන් ඇපා සෙනෙවිරත්න මහතා හා විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් රැසක් සහභාගී වූහ.

## වසර 5 කට පසුව පැවති ජනාධිපති විද්‍යාලයීය හිස් වෙස් තැබීමේ මංගල්‍යය



කෝට්ටේ ජනාධිපති විද්‍යාලයේ උඩරට නර්තන විෂය හදාරන සිසු දරුවන් 36 දෙනකු වෙනුවෙන් හිස වෙස් තැබීමේ මංගල්‍යය 2024 පෙබරවාරි 02 වැනි දින පැවැත්විණි.

සාම්ප්‍රදායික සිරිත් විරිත් අනුව ඉටුකෙරෙන ආගමික වතාවත් රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ ශ්‍රී ජයශේඛරාරාමයේදීද නර්තන ප්‍රසංගය ජනාධිපති විද්‍යාල පරිශ්‍රයේදීද උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

මෙවැනි උළෙලක් විදුහලේ පැවැත්වූයේ වසර 5 කට පමණ පසුව බවත් අනාගත පරපුර අපගේ ඉපැරණි කලා සම්ප්‍රදායයන් රැකගැනීම උදෙසා උනන්දු කරවීම මෙම උළෙල සංවිධානය කිරීමේ අරමුණ බවත් ජනාධිපති විද්‍යාලයීය විදුහල්පති ලුතිනන් කර්නල් ඩී. ඒ. ඩී. වානගුරු මහතා පැවසීය.

## කෝට්ටේ පුරවරයට යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානයක්







තරුණ දරු දැරියන්ගේ නායකත්ව හා වෘත්තීය පුහුණුව උදෙසා වූ කොළඹ දිස්ත්‍රික් ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථානය 2024 මාර්තු 28 වැනි දින රාජගිරිය බණ්ඩාරනායකපුර ක්‍රීඩා සංකීර්ණ භූමියේදී ක්‍රීඩා, යෞවන කටයුතු, සංචාරක හා ඉඩම් අමාත්‍ය හරීන් ප්‍රනාන්දු මහතා විසින් විවෘත කෙරිණි.

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මහතාගේ සක්‍රිය දායකත්වයෙන් මෙම මධ්‍යස්ථානය කෝට්ටේ දරු දැරියන් වෙත උරුම විය. මෙම ගොඩනැගිල්ල අවශ්‍යතාව පරිදි නවීකරණය කර දීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවෙන් ඉටුවූ මෙහෙවර මෙය විවෘත කිරීමේ උත්සවයේදී මධුර විතානගේ මහතාගේ විශේෂ ඇගයීමට ලක්විය.

මෙම අවස්ථාව සඳහා කෝට්ටේ හිටපු නගරාධිපති ශාන්ත ප්‍රේමලාල් මහතා, නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය, නාගරික ලේකම් රත්නා වසන්ති වික්‍රමරත්න මහත්මිය හා යොවුන් සේනාංකය නියෝජනය කරමින් එහි නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.

## කෝට්ටේ පුස්තකාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් එක්දින වැඩමුළුවක්



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින් පාලනය වන රාජගිරිය මධ්‍ය පුස්තකාලය, නුගේගොඩ, උඩහමුල්ල, බැද්දගාන මහජන පුස්තකාල හා කියවීම් ශාලා කාර්ය මණ්ඩලය සඳහා වූ එක් දින වැඩමුළුවක් 2024 මාර්තු 22 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලා-වේදී පැවැත්විණි.

මෙහිදී 'පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා මෘදු කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීම' මැයෙන් ජාතික පුස්තකාලයේ පුහුණු නිලධාරිනී බුද්ධිනී දිසානායක මහත්මිය විසින්ද 'පුස්තකාල කළමනාකරණය' මැයෙන් ජාතික පුස්තකාලයේ සහකාර අධ්‍යක්ෂ (පුහුණු නිලධාරි) එම්. අරවින්ද මහතා විසින්ද දේශන පැවැත්විණි.

## බෞද්ධ සංගමයේ ධර්ම දේශනාව මෙවරත්



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ බෞද්ධ සංගමය මාසිකව සංවිධානය කරන ධර්ම දේශනාව මෙවර 2024 මාර්තු 21 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

කලපළුවාව ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය දඹරැල්ලේ විමලසාර ස්වාමීන් වහන්සේ විසින් ධර්ම දේශනාව පවත්වනු ලැබිණි.

මෙවර පින්කමේ දායකත්වය දරන ලද්දේ නාගරික මූල්‍ය දෙපාර්තමේන්තුව විසිනි. මැදින් පොහෝය නිමිති කොටගෙන ධර්ම දේශනාව සංවිධානය කෙරිණි.

## මහා නගර සභා 'මහජන දිනය' සෑම සඳුදාවකම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මියගේ මූලිකත්වයෙන් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් 'මහජන දිනය' සෑම සඳුදා දිනයකම පෙරවරු 10.00 මධ්‍යහ්න 12.00 දක්වා මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

මහා නගර සභාවෙන් විසඳගැනීමට ඇති ගැටලුවලට පිළිතුරු ලබාගැනීම, නිලධාරීන් හමුවීම ඇතුළු කටයුතු වෙනුවෙන් මෙම දිනය ප්‍රයෝජනයට ගන්නා මෙන් නාගරික කොමසාරිස්තුමිය කෝට්ටේ ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලා සිටියි.

## පොත් පත් වෙත දරුවන් නැඹුරු කරවාගැනීමට ගත් අපූරු උත්සාහයක්



පාසල් දරුවන් පොත පත හා පුස්තකාල කෙරෙහි සමීප කරවාගැනීමේ අරමුණෙන් සංවිධානය කෙරුණු ක්ෂේත්‍ර චාරිකාවක් හා දේශනයක් 2024 මාර්තු 19 වැනි දින රාජගිරිය මධ්‍ය පුස්තකාලයේදී පැවැත්විණි.

රාජගිරිය ඔබේසේකරපුර පැරකුම්බා විද්‍යාලයේ 6, 7, 8 ශ්‍රේණිවල ඉගෙනුම ලබන දූ දරුවන් උදෙසා සංවිධානය කෙරුණු මේ අවස්ථාව කෝට්ටේ ප්‍රධාන පුස්තකාලයාධිපති සුජීව ප්‍රනාන්දු මහතාගේ මෙහෙයවීමෙන් පැවැත්විණි.

මේ සඳහා නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය, නාගරික ලේකම් රත්නා වසන්ති වික්‍රමරත්න මහත්මිය, පැරකුම්බා විදුහලේ විදුහල්පති එච්. ජී. පී. හෙට්ටිගොඩ මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.



18 පිටුවට

## 'කතුවරයා හා ඔහුගේ නිර්මාණ ප්‍රවේශය' සංවාදය බැද්දගාන පුස්තකාලයේදී

'කතුවරයා හා ඔහුගේ නිර්මාණ ප්‍රවේශය' මැයෙන් සම්මානනීය ගත් කතුවර කීර්ති වැලිසරගේ සූරීන් සහභාගී වූ සුහද සංවාදයක් 2024 පෙබරවාරි 11 වැනි දින බැද්දගාන මහජන පුස්තකාලයේදී පැවැත්විණි.

බැද්දගාන මහජන පුස්තකාල කාර්ය මණ්ඩලය හා එහි පාඨක සමාජය විසින් මෙම අවස්ථාව සංවිධානය කෙරිණි.



## කෝ. ම. න. ස. කා. කා. සංගමයෙන් උතුම් පරිත්‍යාගයක්





ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ කාර්යාල කාර්ය සහයකයින්ගේ අන්‍යොන්‍යාධාර සමිතිය පසුග ියදා උතුම් සමාජ මෙහෙවරක නිරත විය. ඒ, 2024 පෙබරවාරි 10 වැනි දින මහා නගර සභා සේවක මහත්ම මහත්මීන්ගේද සහයෝගය ඇතිව අනුරාධපුර මහා රෝහලේ තැලසීමියා රෝගී ඒකකයේ දරු දැරියන් වෙනුවෙන් වියළි ආහාර මලු ලබාදීමය.

මෙම සමාජ මෙහෙවර අනුරාධපුර මහා රෝහලේ තැලසීමියා ඒකකයේ ප්‍රධානී වෛද්‍ය කිලෝෂණී හැන්දේවිතරණ මහත්මියගේ නොමඳ පැසසුමට ලක්විය. මෙවන් වූ ආකාරයේ ආධාර කළ හැකි අය වෙතොත් 070 528 9300 අංකයට අමතන මෙන් ඇය ඉල්ලා සිටින්නීය.

පෙබරවාරි 11 වැනි දින මෙම සමිතියේ සාමාජිකයෙ-් ජාතික උරුමයක් වන අනුරාධපුර අභයගිරි දාගැබ අවට පරිසරය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයකද නිරත වූහ.

## වැලිකඩ රාජගිරිය ව්‍යාපාරික එකමුතුවෙන් ලේ දන්දීමේ කඳවුරක්



වැලිකඩ රාජගිරිය එක්සත් වෙළෙඳ සංගමය විසින් 12 වැනි වරට සංවිධානය කරන ලද ලේ දන් දීමේ කඳවුරක් 2024 මාර්තු 24 වැනි දින රාජගිරිය වැලිකඩ ප්ල-ාසා වෙළෙඳ සංකීර්ණයේදී පැවැත්විණි. රටේ උද්ගතව ඇති උග්‍ර ලේ හිඟයට පිළියමක් ලෙසින් සංවිධානය කරන ලද මේ පුන්‍යකර්මය වෙනුවෙන් විශාල ජනතා සහභාගීත්වයක් පැවති බව එම සංගමය පවසයි.

E MAGAZINE පළ කෙරෙනුයේ කෝට්ටේ පුරවැසි ඔබ වෙනුවෙනි.

ඔබගේ අදහස්, යෝජනා හා ප්‍රාදේශීය පුවත් අපට ලියා එවන්න.

Email:kmcmediaunit3@gmail.com

රම්පෙ, කරපිංචාත් මිලට ගන්නා කාලයක අපේම කියා

# ගෙවත්තක් සැලසුම් කරමු





## අපේ ගෙවත්ත





ගෙවතු වගාව අද එක්තරා විලාසිතාවක් තරමට ජනප්‍රිය විනෝදාංශයක් බවට පත්ව තිබේ. එය ඉතාමත් හොඳ තත්ත්වයකි. ගෙවතු වගාවක් ආරම්භ කළයුත්තේ ඇයි? යන තේමාව යටතේ පසුගිය ‘ශ්‍රී පුර’ කලාපයේ මේ විශේෂාංගය යටතේ කරුණු සාකච්ඡා කළෙමු. මෙවර අපගේ අවධානය යොමුවනුයේ ගෙවත්තක් සැලසුම් කරගන්නා ආකාරය කෙරෙහිය.

ඔබගේ නිවස අවට ගෙවත්ත ප්‍රයෝජනවත් ආකාරයෙන් වගාකිරීමට අදහස් කරන්නේ නම්, පවතින ගොඩනැගිලි, ගස්වැල් සහ ඉඩ කඩ සැලකිල්ලට ගනිමින් සැලැස්මක් සහිතව හෝ සැලැස්මක් රහිතව බෝග සිටුවිය හැකි වේ.

ඉඩමේ පිහිටීම, හැඩය, පාංශු වාතය, ප්‍රදේශයේ දේශගුණය යනාදි කරුණු ගැන සැලකිලිමත් වීමද මෙහිදී වැදගත් වේ. පවුලේ සාමාජිකයන්ගේ ආහාර රුචිකත්වය ගැන කල්පනා කර බෝග තෝරාගත යුතුය.

සැලැස්මක් රහිතව වගාකිරීමට සිදුවනුයේ පවතින ඉඩ කඩ සීමිත වන අවස්ථාවලදීය. එවිට ඉඩ කඩ ඇති ස්ථානවල පාත්ති සකස් කිරීමක් නොමැතිව සුදුසු පරිදි අවශ්‍ය පැළ වර්ග වැඩි ප්‍රමාණයක් සිටුවාගත යුතුය.

සැලැස්මක් ඇතිව වගා කිරීමේදී ඒ ඒ බෝග වර්ග සඳහා සුදුසු ස්ථාන තෝරාගත යුතුය. අනතුරුව වළවල් තුළ හෝ පාත්තිවල නියමිත පිළිවෙළකට බෝග සිටුවිය හැකි වේ.

කොස්, දෙල්, අඹ, රඹුටන්, අලිගැටපේර, මුරුංගා, තේක්ක, හල්මිල්ල, මැහෝගනී ආදී බහුවාර්ෂික ස්ථිර ශාක වර්ග හැකි තරම් දුරට ගෙවත්තේ මායිමට ආසන්නව හෝ මායිම් වැටට සිටුවාගැනීම වඩාත් සුදුසුය. එහෙත් එමගින් අසල්වැසියන්හට කරදරයක් නොවන්නට වගබලාගත යුතුය.

ගෙවත්තේ මැද සෙවන අවශ්‍ය වන ස්ථානවලද එවැනි ශාක සිටුවාගත හැකි වේ. සෙවන ඇති ස්ථානවලට ගම්මිරිස්, කෝපි, කහ, ඉඟුරු, කිරි අල, දෙහි අල ආදි සෙවන ප්‍රිය කරන බෝග සිටුවීම වඩාත් යෝග්‍ය වේ.

(ලිපි මාලාව සඳහා තොරතුරු සම්පාදනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත 'ගෙවතු වගාව' සඟරාව ඇසුරිනි.)

# වගාවෙන් ලැබෙන ආදායම ජීවත්වෙන්න ප්‍රමාණවත්



මිනිසුන් හැටියට උපන් අපගේ ජීවිතවලට සැබෑ වටිනාකමක් උරුම වන්නේ අප අපගේ ජීවිත ගතකරන ආකාරය අනුවය. යම් කෙනකු තමන් ලැබූ ජීවිතය අර්ථවත්ව, වැඩදායකව ගතකිරීම තුළින් සමාජයට වැදගත් දායාදයන් තිළිණ කළ හැකි වන්නේ නම් ඔහු හෝ ඇය ජීවිතය ජය ගත් අයෙකි. මේ විශේෂාංගයෙන් කතාබහ කෙරෙන්නේ එවන් චරිත පිළිබඳවය. අංක 70/26, 4 වැනි පටුමග, මොරගස්මුල්ල, රාජගිරිය ලිපිනයේ පදිංචි ඔහු තම කාලයෙන් උපරිම ඵල නෙළාගනිමින් දැවැන්ත වගා ව්‍යාපෘතියක නිරත වේ. මේ ඔහු අපට කියන කතාවය.

**ඔබගේ නම?**

සුනේන්ද්‍ර ගෝමස්

**වයස?**

අවුරුදු 55 යි.

**මෙවැනි වගාවක් ආරම්භ කරන්න අදහසක් ඇතිවුණේ කොහොමද?**

තාත්තත් වගා කළා. ඒ එක්කම අවුරුදු දහයෙ විතර ඉඳන් තමයි මමත් වගා වැඩවලට පුරුදු වුණේ. කාලයක් මම විදෙස්ගත වෙලා සිටියා. ඒ කාලෙදි විතරයි මට වගාව මගහැරුණෙ.

**වගා කර තිබෙන බෝග වර්ග ගැන කතා කළොත්.**

පළා වර්ග හා එළවළු වර්ග තමයි මම වවන්නෙ. නම් වශයෙන් කිව්වොත් බණ්ඩක්කා, වැටකොළු, මෑකරල්, පිපිඤ්ඤා, බෝංචි, මාළු මිරිස්, අමු මිරිස්, කරවිල, ගෝවා, වම්බටු, නෝකෝල්, නිවිති වගේම කංකුං ඇතුළු පළා වර්ග.

**වගා කර තිබෙන ඉඩ ප්‍රමාණය කොයිතරම්ද?**

අක්කර තුන්කාලක් පමණ.

**වගාවට එල්ල වන බාධා මොනවාද?**

තෙත් බිමට යාබදව වගා කරන නිසා ගං වතුර තමයි ප්‍රධාන බාධකය. ඒ හැරෙන්න ඉත්තෑවන්ගෙන්, කෘමි සතුන්ගෙන් බාධා එල්ල වෙනවා.



21 පිටුවට



**කෘමීන්ගෙන් ඇතිවන හානිය පාලනය කරගන්නේ මොන වගේ ක්‍රමවලින්ද?**

කෘමි පාලනය සියයට අනූවක්ම ස්වාභාවික ක්‍රමවලට අනුවයි සිදුකරන්නෙ. කටු අනෝදා කොළ තම්බපු වතුර පත්‍රවලට ඉසීමෙන් කොළ කොඩ වීමේ රෝගය පාලනය කිරීම උදාහරණයක්. තව ඉල්මැස්සන්ගෙන් ආරක්ෂා කරගන්න පොලිතීන් උර යොදනවා.



**මෙය මුලුමනින්ම කාබනික පොහොර මත පමණක්ම පදනම් වූ වගාවක්ද?**

ප්‍රධාන වශයෙන්ම මම යොදාගන්නේ කොම්පෝස්ට් පොහොර. ඒ පොහොර හා දියර පොහොර වගා බිමේදීම මම නිපදවාගන්නවා. මම කරන්නේ පුළුවන් තරම් පසේ ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය වැඩි කරගන්න එකයි.



**අස්වැන්න අළෙවි කරගන්නේ කොහොමද?**

බොහෝ දෙනෙක් වගා බිමටම ඇවිත් අස්වැන්න මිල දී ගන්න හුරු වෙලා ඉන්නවා. ඒ හැම දෙනාටම දෙන්න ඕන නිසා මම අස්වැන්න සීමිත ප්‍රමාණවලින් සාධාරණ මිලකට අළෙවි කරනවා. හැබැයි බොහෝ විට බණ්ඩක්කා නම් අතිරික්තයක් තියෙනවා. එහෙම වුණොත් ඒවා නගරයේ වෙළෙඳ පොළවලට අළෙවි කරන්න පුළුවන්.

**මේ කටයුත්තට ලැබෙන අනුග්‍රහ මොනවාද?**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලැබෙනවා.




**ඔබ මේ වගාව කරන්නේ පූර්ණකාලීනවද?**

කාලයක් මම විදෙස්ගත වෙලත් සිටියා. ඒ ගිහින් ඇවිත් ව්‍යාපාර කිහිපයකුත් කළා. ඒවා මේ වෙද්දි අසාර්ථක වෙලයි තියෙන්නෙ. දැන් මගේ සම්පූර්ණ කාලය වැය වෙන්නෙ මේ කාර්යය වෙනුවෙන්. මේක බොහොම සතුටින් යෙදෙන්න පුළුවන් විනෝදාංශයක්. මගේ පුතාගෙනුත් මේ කටයුත්තට ලැබෙන්නේ විශාල සහයෝගයක්. මෙයින් ලැබෙන ආදායම ජීවත් වෙන්න ප්‍රමාණවත්.



සංවාද සටහන
**නදුන් අමන්ද**

# හෘදයාබාධ ගැන දැනගනිමු



## හෘදයාබාධවලට අත වනන රුධිර පීඩනය

'පපුවේ අමාරුව', 'හාට් ඇටෑක්' ලෙසින් කොයි තවුරුත් දන්නා තරමක් බැරෑරුම් ලෙසින් කිවහොත් 'හෘදයාබාධ' ලෙසින් හඳුන්වන රෝගයට අද ගොදුරු වන තරුණ හා මැදි වයස් කාණ්ඩවල පසුවන්නන්ගේ ප්‍රමාණය ඉතාමත් ඉහළ මට්ටමකට පත්ව තිබේ. මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයකි. මන්ද මෙය මරණයෙන් කෙළවර වීමේ වැඩි ඉඩ කඩක් ඇති රෝගයක් නිසා ය. මේ අවදානම් තත්ත්වය සැලකිල්ලට ගෙන හෘදයාබාධ පිළිබඳ සරල, සවිස්තරාත්මක ලිපි පෙළක් 'ශ්‍රී පුර' පසුගිය කලාපයේ පටන් ඉදිරිපත් කිරීමට තීරණය කළෙමු. ඒ ලිපියෙන් අප සාකච්ඡා කළේ මිනිස් හෘදය හා හෘදයාබාධයක් යනු කුමක්ද යන කාරණාව සම්බන්ධයෙනි.



**මේ ලිපියෙන් අප ඔබගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වන්නේ හෘදයාබාධයක් ඇතිවීමට බලපාන සාධක පිළිබඳවය. මේ සාධක අතරින් පළමුවෙන්ම සාකච්ඡා කෙරෙනුයේ 'රුධිර පීඩනය' නම් සාධකයයි.**

### රුධිර පීඩනය යනු?

ලේ ගමන් කරවීම සඳහා හෘදය මගින් යොදන බලය රුධිර පීඩනය යනුවෙන් හැඳින්වේ. අධි රුධිර පීඩනය යනු හෘදයේ සිට පිටතට රුධිරය ගෙන යන ධමනි තුළ පවත්නා රුධිර පීඩනය රෝගියාගේ වයසට හා ස්ත්‍රී පුරුෂභාවයට නොගැළපෙන ආකාරයට දිගින් දිගටම ඉහළ ගොස් පැවතීමය.

### රුධිර පීඩනය ඉහළ යාමට හේතු

- **පරම්පරාවෙන් පරම්පරාවට රෝගය පැතිර යාම (දෙමවුපියන්ට දරුවන්ගෙන් ආදි වශයෙන්)**
- **ලුණු වැඩිපුර අඩංගු ආහාර අනුභවය**
- **පොටෑසියම් ලවණ අඩංගු ආහාර අඩුවෙන් අනුභව කිරීම**
- **ප්‍රෝටීන් වැඩිපුර අඩංගු ආහාර අනුභවය**
- **මානසික අසහනය**

### රුධිර පීඩනයේ රෝග ලක්ෂණ



- **උදෑසන කාලයේදී ගෙළ ජ් ටු ප ස ඉහළ ප්‍රදේශයේ ඇතිවන වේදනාව**
- **නිතර පවතින හිසරදය හා කරකැවිල්ල**
- **හුස්ම ගැනීමේ අපහසුව**
- **නාසයෙන් ලේ ගැලීම**
- **මුත්‍රා අධිකව පහවීම**
- **පෙනීම අපැහැදිලි වීම**
- **අත පය අප්‍රාණික වීම**

### දියවැඩියාවේ ප්‍රතිඵල

- **හදවතට බලපෑමෙන් හෘදයාබාධ**
- **මොළයට බලපෑමෙන් අංශභාගය**
- **ඇස්වලට බලපෑමෙන් අන්ධභාවය**
- **වකුගඩුවලට බලපෑමෙන් වකුගඩු අක්‍රිය වීම**

වෛද්‍ය වාර්තා සහ පොත පත ඇසුරිනි
සුනෙත් ජයකොඩි

සුවසෙත



# දිව ඔසුවක් වන් කෙසෙල් මුව

කෙසෙල් ලොව පුරාම ප්‍රචලිත පලතුරක් බවට කිසිදු විවාදයක් නැත. එසේ වුවත් කෙසෙල් මුව ආහාරයට ගන්නේ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් කිහිපයක ජනයා පමණි. ඊට හේතුව එයට හිමි 'ගුණය' පිළිබඳ බහුතරයකට පැහැදිළි අවබෝධයක් නොතිබීමය.



ලෝකයේ කෙසේ වෙතත් කෙසෙල් මුව සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික අප තුළ ඇත්තේද අල්ප අවබෝධයකි. මෙහි ඇත්තේ අසීමිත පෝෂණ ගුණයක් හා ඖෂධීය ගුණයකි.

අලුත්ම විද්‍යාත්මක සොයාගැනීම්වලට අනුව කෙසෙල් මුව ග්‍රෑම් 100 ක යකඩ මිලිග්‍රෑම් 56.4 ක් අඩංගු වේ. මේ හේතුවෙන් කෙසෙල් මුව 'පෝෂණ ලොවේ යකඩ ආකරය' ලෙසින් පෝෂණවේදීහු සලකති.

පීකුදුවල මෙන් දස ගුණයක්ද නිවිතිවල මෙන් විසි ගුණයක්ද කෙසෙල් මුවවල යකඩ අඩංගු වන බව තහවුරු වී තිබේ. මේ හේතුවෙන් නිර්මාංශ ජීවිත ගතකරන්නන්ට ප්‍රෝටීන අවශ්‍යතා සපුරාගැනීමට කෙසෙල් මුව වඩාත් සුදුසු ආහාරයකි.

යකඩ හැරුණු විට කෙසෙල් මුවවල බහුලව අඩංගු වන ඛනිජ වර්ගය වනුයේ තඹ ය. තවද පොටෑසියම්, කැල්සියම්, මැග්නීසියම්, සෙලෙනියම්, සින්ක් ආදී ඛනිජ වර්ග රැසකින් කෙසෙල් මුව පොහොසත්ය.

කෙසෙල් මුව ප්‍රෝටීන් බහුල ආහාරයක් ලෙසද විටමින් 'ඒ' සහ 'ඊ' අඩංගු ආහාරයක් ලෙසද වැදගත් වන්නකි. මෙකී ගුණාංග හේතුවෙන් සිරුරට හානිකර රසායනිකයන් විනසන ප්‍රතිඔක්සිකාරක ගුණය දරයි. මේ ගුණය හේතුවෙන් පිළිකාව, ස්නායු රෝග, හදවත් රෝග ඇතිවීමේ හැකියාව අවම වේ, මළබද්ධය වළක්වයි, අධි රුධිර පීඩනය හා දියවැඩියාව පාලනය වේ, සම නිරෝගී වේ, අකලට වයස්ගත වීම පාලනය වේ.

එතනෝල් සුලු වශයෙන් කෙසෙල් මුවවල ඇත. එබැවින් එමගිනි සිරුරට හානිකර බැක්ටීරියාවන් විනාශ වේ.

කිරි දෙන මවුවරුන්ට කෙසෙල් මුව යෝග්‍ය වනුයේ එමගින් කිරි එරෙන නිසාය. කෙසෙල් මුවවලට ප්‍රොජෙස්ටරෝන් හෝර්මෝනය උත්තේජනය කිරීමේ හැකියාව තිබේ. එමගින් ගර්භාෂයේ පේශි ශක්තිමත් වේ. තවද මාසික ඔසප් වීමේදී සිදුවන අධික රුධිර වහනය කෙසෙල් මුව ආහාරයට එක්කර ගැනීමෙන් පාලනය වේ.


කෙසෙල් මුව සිහින් කැබලිවලට කපා කෙසෙල් දලුවල ඔතා උණු අළු පල්ලේ තබා තම්බා මිරිකාගත් යුෂය අතීසාරයට හා අජීර්ණ රෝගවලට වඩාත් ගුණදායකය.

කෙසෙල් මුව කුඩා දරුවන්ටද වඩාත් යෝග්‍ය වනුයේ එයින් ආහාර රුචිය වර්ධනය කරවන නිසාය.

කොස් ඇට, පරිප්පු, තිබ්බටු, කරවල, හාල්මැස්සන් ආදිය සමගින් මිශ්‍ර කරගැනීමෙන්ද සම්බෝල, සලාද මැල්ලුම් ආදි වශයෙන්ද සකසා ආහාරයට ගත හැකි සුමිහිරි ආහාරයකි.




නිර්මාණී කොඩිකාර




# අපේ රටේ කලාවේ අනාගතය ඒ තරම්ම අඳුරු නෑ

# ඩග්ලස් රණසිංහ

## ප්‍රවීණ රංගනවේදී



වේදිකා නාට්‍යය, සිනමාව හා ටෙලි නාට්‍යය යන කලා ක්ෂේත්‍රයන් තුළ සදානුස්මරණීය රංගන ප්‍රතිභාවන් පළකළ හෙතෙම දිගු කලක් ජාත්‍යන්තර මට්ටමේන් රංගන කලාව පිළිබඳ එංගලන්තයේදී පුහුණුවක් ලැබුවේය. හේ පිටකෝට්ටේ වාසභූමිය බවට පමුණුවාගෙන සිටින ඩග්ලස් රණසිංහයන්ය. මෙවර ශ්‍රීපුර පිළිසඳර විශේෂාංගයෙන් අපි ඔහු ඔබ අභිමුවට කැඳවාගෙන එන්නෙමු.

### ළමා විය සම්බන්ධ තොරතුරු?

මගේ උපන් දිනය 1945 මැයි 27 වැනිදා. මම ඉපදුණේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙ තෝරවතුර ගම්මානයේ. අධ්‍යාපනය ලැබුවේ කුරුණෑගල සාන්ත ආනා මහා විද්‍යාලයේ. ඒ කාලෙ ලංකාවෙ තිබුණ උසස් පාසල් දහතුනෙන් එකක් ඒක. පාසල් සමයේදී ක්‍රීඩාවට බොහොම ළැදිකමක් තිබුණා. ඒ කාලෙ පාසල් ශිෂ්‍ය භට කණ්ඩායමෙත් සාමාජිකයෙක්. දියතලාව කඳවුරේදි දක්ෂතම රයිෆල් වෙඩික්කරුවා විදිහට සම්මානත් ලැබුවා. ශිෂ්‍ය භට කණ්ඩායම් භාර සාජන්ට්වරයෙක් විදිහටත් කටයුතු කළා. බොක්සිං, මලල ක්‍රීඩාවලටත් සහභාගි වුණා. ඒ වගේම පාසලේ ඉගෙනීමේ කටයුතුත් හොඳින්ම කළ කෙනෙක් මම.


25 පිටුවට



**ඔබ වේදිකා නාට්‍ය නළුවෙක් වෙන්නෙ බොහොම තරුණ අවධියෙදි නේද?**

පියාට ඕන වුණේ මම නීතිඥයෙක් වෙනවා දකින්න. නීති විද්‍යාලයට බැඳෙන්න කොළඹ ආවා 1960 ගණන්වල. ඒ අතරෙ පොලිසියට බැඳෙන්නත් ඉල්ලුම් පත්‍ර දාල තිබුණා. ඒ කාලයේ පොලීසිය භාර අමාත්‍යවරයා වුණේ ජේ. ආර්. ජයවර්ධන මහතා. සතිස්චන්ද්‍ර එදිරිසිංහගේ සහෝදරයෙක් එතුමාගෙ පුද්ගලික ලේකම්. මං සතිස්ව අඳුනනවා. ඒ මාර්ගයෙන් ගියේ ඔහුගේ සහෝදරයගෙන් උදවුවක් ඉල්ලන්නයි. සතිස් මට කිව්වා මං ඔයාට උදවුවක් කළා. දැන් ඔයා මට උදවුවක් කරන්න කියලා. හෙන්රි ජයසේන මහත්තයා මං බලාපොරොත්තුවෙන් ඉන්නවා හුණුවටයේ කතාවෙ එක චරිතයක් භාරදෙන්න. හැබැයි මට ඒකට යන්න විදිහක් නෑ. මට ගුණසේන ගලප්පත්තිගෙ නාට්‍යයක ප්‍රධාන චරිතයක් කරන්න තියෙනවා කිව්වා. මට උදවුවක් විදිහට මේ නාට්‍ය පිටපත අරගෙන ගිහින් හෙන්රි ජයසේන මහත්තයව මුණගැහෙන්න කිව්වා. ඒ චරිතයට ඔයා හොඳට ගැළපෙනව කියලත් කිව්වා. ඒක හමුදාවෙ කෝප්‍රල් කෙනෙක්ගෙ චරිතයක්.


මේ චරිතය බොහොම ජනප්‍රිය වුණා. ලංකාවෙ අස්සක් මුල්ලක් නෑර මම දැක බලාගත්තෙ හුණුවටයේ කතාවෙන්. අපි මේ නාට්‍යය පෙන්නුවේ බොහොම දුෂ්කරතා විඳිමින්. ලාභ ලබනවාට වඩා ප්‍රේක්ෂකයින්ගෙ රස වින්දනය වෙනුවෙන් ඇප කැප වීමෙන් තමයි මේ නාට්‍යය කළේ. පළමුවැනි වතාවට යාපනයේ ද්‍රවිඩ ජාතිකයෝ නාට්‍ය සංවිධානයක් පිහිටුවලා පෙන්වපු මුල්ම සිංහල වේදිකා නාට්‍යය තමයි හුණුවටයේ කතාව.

**ඔබ රංගනයෙන් දායක වුණු දෙවැනි වේදිකා නාට්‍යය තමයි 'අපට පුතේ මගක් නැතේ.' මෙයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබුණේ කොහොමද?**

මේ කතාව නිර්මාණය වෙන්නේ අසාධාරණයට ලක්වුණු විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් වටායි. මේ නාට්‍යය නිෂ්පාදනය කළේත් හෙන්රි ජයසේනයන්. ඒ ශිෂ්‍යයාගේ චරිතය නිරූපණය කළේ මමයි. මේ නාට්‍යයත් ඉතාමත් ජනප්‍රිය වුණා. ඔය තමයි මගේ කලා ජීවිතයේ ආරම්භය.

**සිනමාවට සම්බන්ධ වෙන්න මග පෑදුණෙත් වේදිකාව නිසා නේද?**

හුණුවටයේ කතාවෙ රඟපාද්දි අපූරු දෙයක් සිද්ධ වුණා. දවසක් මේ නාට්‍යය බලන්න ආවා ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්තයා. ඒ මහතා හෙන්රි ජයසේන මහත්තයට කියල තියෙනවා නාට්‍යයෙන් පස්සේ මේ නාට්‍යයේ කෝප්‍රල් චරිතය කරපු කෙනාට ඇවිත් තමාව මුණගැහෙන්න කියලා. ඒ හමුවෙන් පස්සේ තමයි මඩවල එස්. රත්නායක මහතාගෙ නවකතාවක් පදනම් කරගෙන ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා අධ්‍යක්ෂණය කළ 'අක්කර පහ' චිත්‍රපටයට මාව තෝරගත්තේ. එතුමා මගේ රඟපෑම බොහොම අගය කළා. මුල්ම චිත්‍රපටයෙන්ම එහෙම



**රොමියෝ ජූලියට් චිත්‍රපටයේ ජවනිකාවක්**

ඇගයීමක් ලබන්න හැකි වීම මම ලබපු විශාල භාග්‍යයක්. ඒ වගේම එතුමාගේ නිහතමානිකමත් මෙයින් මම හොඳින්ම තේරුම් ගත්තා.

ඉන්පස්සේ මම ජී. ඩී. එල්. පෙරේරා මහතා අධ්‍යක්ෂණය කළ 'රෝමියෝ ජුලියට්' චිත්‍රපටයේ රෝමියෝ චරිතය රඟපෑවා. මම මේ වෙද්දි චිත්‍රපට 40 ක පමණ හා ටෙලි නාට්‍ය 50 ක පමණ රඟපාලා තියෙනවා.

**ඔබ සෑහෙන කාලයක් රංගනවේදය පිළිබඳ විදෙස් පුහුණුවක් ලබනවා. මේ අවස්ථාව උදාවෙන්නේ කොහොමද?**




පෝල් සෙල්ස් කියන ජර්මන් ජාතික චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක් ලංකාවට ආවා. ඔහු බොහෙම ධනවතෙක්. ඉන්දියාව ඔහුට එහි ගෞරවණීය පුරවැසිභාවය දෙන්න කැමති වුණාත් ඔහු එය ප්‍රතික්ෂේප කළා. ඔහු පදිංචි වෙන්න කැමැත්තෙන් ඉඳලා තියෙන්නෙ ලංකාවෙ හෝ බාලි දූපත්වලයි. මම ඇතුළු කිහිප දෙනෙක් ඔහුව ලංකාවේ නතර වෙන්න කැමති කරගත්තා. ඔහුට ලංකාවෙ ගෞරවණීය පුරවැසිභාවය ලැබුණා. ඔහුට රජයේ චිත්‍රපට අංශය භාර කෙරුණා. ඔහු තමන්ගෙ පෞද්ගලික ධනයෙන් මේ ආයතනය හොඳින් දියුණු කළා. ඔහු මං ගැන බොහොම පැහැදීමකින් සිටියේ. ඔහු නිර්මාණය කරපු 'භාවනා' චිත්‍රපටයෙ ප්‍රධාන චරිතයට මාව තෝරගත්තා. ඔහුට උවමනා වුණේ මාව ඔහුගේ සහාය අධ්‍යක්ෂවරයා කරගන්නයි. ඔහු මට කිව්වා චිත්‍රපට හා නාට්‍ය පාසලක් ලංකාවෙ ආරම්භ කරමු කියලා. ඒකට සුදුසුකම් ලබාගන්න ඔහුට ඕන වුණා මට එංගලන්තයෙ **London International Film and Drama School** එකේ පුහුණුවක් ලබාදෙන්න. ඒකට ඇතුල් වෙන්න මම පිටපත ලියලා **Dancing devils** කියලා කෙටි චිත්‍රපටයක් හැදුවා. ගමක ළමයෙක් අසනීප වෙලා තොවිලයක් කරලා ලෙඩ සනීප කරන කතාවක් ඒක. මේ නිර්මාණය පිළිඅරගෙන මාව ඒ ආයතනයේ පුහුණුවට බඳවගත්තා.

හැබැයි හිතුවට වැඩිය කාලය ගතවුණා. මම එහෙදි අදූරදර්ශී මෝඩ වැඩක් කළා. **Drama School** එකේ පුහුණුව ඉවර වෙද්දි මුලු ලෝකයේම ශිෂ්‍යයෝ උත්සාහ කරන්නේ ලන්ඩන් තියටර් එකට බැඳිලා ඒකෙ නළුවෙක් වෙන්නයි. පාඨමාලාව ඉවර වුණාට පස්සේ මට ආරාධනාවක් ලැබුණා ලන්ඩන් තියටර් එකට බැඳෙන්න කියලා. මම කැමති වුණේ නැහැ. මම කිව්වා ලංකාවෙ චිත්‍රපට හා නාට්‍ය පාසලක් පටන්ගන්න මම එනකං බලාගෙන ඉන්නවා කියලා.

මට ආරාධනා කළ යුවළ කිව්වා ඔයාගෙ නාට්‍ය කණ්ඩායමේ පනස් ගාණක් ඉන්නවා තව හය මාසයක් ඉඳලා ඊට පස්සේ ඔයා යන්න කිව්වා. ඒ වෙද්දි මේ ආයතනයෙන් පෙන්නන්න සූදානම් කරලා තිබුණු නාට්‍යයක චරිතයකට තමයි මාව තෝරගෙන තිබුණෙ. මේ යුවළ කිව්වා අපි එක දිගට මාස 6 ක් මේ නාට්‍යය පෙන්නනවා. මේක ඔයාට ආසියාතිකයෙක් හැටියට ලැබෙන ඉතාමත් දුර්ලභ අවස්ථාවක් කියලත් කිව්වා. ඒ වගේම සුදුසුකම් තියෙන අයත් අඩුයි කිව්වා. අපි මේ අවස්ථාව රත්තරන් බන්දේසියක තබා ඔයාට පිළිගන්වනවා. ඒත් ඔයා ඒකට පයින් ගහන බවයි ඔවුන් මට කිව්වෙ.

ඒ වෙද්දි මම එංගලන්තෙට ගිහිල්ලා අවුරුදු 10 කට කිට්ටුයි. මට ගෙදර එන්නත් ඕනකම තිබුණා. මම මගේ කලා ජීවිතේ අනාගතය ගැන ඒ තරම් දුරට හිතුවෙ නැහැ. වැඩේ කියන්නෙ මම මෙහෙ එද්දි පෝල් සෙල්ස් අභාවයට පත්වෙලා. නාට්‍ය චිත්‍රපට හා නාට්‍ය පාසල තේරුණෙත් නැහැ. මගේ සැලසුම් සේරම ඉවරයි.

එංගලන්තෙදි මම රූපවාහිනී කලාවත් හැදෑරුවා. ඒ වෙද්දි අපේ රටට රූපවාහිනිය ඇවිත් තිබුණෙත් නැහැ. මම මෙහෙ ඇවිත් ටික කාලයකින් අපේ රටේ රූපවාහිනී සේවය ආරම්භ වුණා.

**ගුවන්විදුලි නාට්‍ය සඳහා වූ දායකත්වය?**

සෝමපාල රණතුංගයන්ගේ නවකතාවක් පදනම් කරගෙන නිර්මාණය වුණු 'ඇස් දෙක' නාට්‍යය ඉතාමත් ජනප්‍රිය වුණා. තවත් නාට්‍යයක මම රඟපෑවෙ ගමක පාලමක් ඉදිකරන නාට්‍යයක ඉංජිනේරුවා හැටියට. ඒ චරිතයේ නම පාලමේ මහත්තයා. දවසක් අපි හුණුවටයේ කතාව ඉවර වෙලා කිහිප දෙනෙකුත් එක්ක එන අතර තේ කඩයක් ළඟ නතර වුණා. මම ඒ මුදලාලිගෙන් ඇහුවා අපිට බොන්න මොනව හරි තියෙනවද කියලා. ඒ මනුස්සයා කඩේ පිටිපස්සට ගිහින් බිරිඳට කියනවා හාමිනේ පාලමේ මහත්තයා ඇවිත් ඉන්නවා ඉක්මනට මොනව හරි ලෑස්ති කරන්න කියලා. ඒ අඳුනගත්තේ මගේ රූපයෙන් නෙවෙයි කටහඬින්. ඉතින් බලන්න ඒ චරිත කොයිතරම් ජනප්‍රියද කියලා. ඔය වගේ මම සම්බන්ධ වුණු ගුවන් විදුලි නාට්‍ය


27 පිටුවට

රැසක් අදත් ගුවන් විදුලි සංස්ථාවේ තියෙනවා



නාට්‍යවලට සම්බන්ධ වෙන්න කලින් මම ගුවන්විදුලියේ නිවේදකයෙක්, සහ හඬ පටිගත කරන්නෙක් විදිහටත් සේවය කර තිබෙනවා. මම එංගලන්තයේ බී බී සී සේවය මගින් විසුරුවා හරින 'සන්දේශය' වැඩසටහනටත් කථනයෙන් සම්බන්ධ වුණා.

**ඔබ රූපවාහිනී හඬකැවීම් ක්ෂේත්‍රයට සම්බන්ධ වුණේ නැද්ද?**

නැහැ. මම ඒ දවසවල ඒකට විරුද්ධයි. ඒත් ලෝකයේ තියෙන හොඳම ටෙලි නාට්‍ය, චිත්‍රපට හඬ කවා ඉදිරිපත් කිරීමේ කිසිම වරදක් මම දකින්නෙ නෑ. එහෙම නැතිව කිසිම හරයක්, ගැඹුරක් නැති නිර්මාණ පිටරටින් ගෙන්වගෙන හඬ කවා ඉදිරිපත් කිරීම ලැජ්ජාවක්.

**ලැබුණු සම්මාන ගැන කතා කළොත්?**

සම්මාන නම් බොහොම ලැබුණා. ඒ අතරින් මම බොහොම ආස කරන සම්මානය තමයි ස්වර්ණසංඛ සම්මානය. ඒ සම්මාන උළෙල දැන් පැවැත්වෙන්නෙ නෑ. ඉතාමත් අවංකව විනිවිදභාවයකින් යුතුව කෙරුණු සම්මාන උළෙලක් විදිහට මම ඒ සම්මාන උළෙල සලකනවා. සුමති ටෙලි සම්මාන උළෙලේදී ලැබුණු ජීවිතයේ එක් වතාවක් පමණක් හිමි වන යූ. ඩබ්ලිව්. සුමතිපාල අනුස්මරණ සම්මානයත් සුවිශේෂයි.

**ඔබ කලක් රාජ්‍ය චිත්‍රපට සංස්ථාවෙ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙසත් කටයුතු කළා.**

70 දශකය ශ්‍රී ලංකා සිනමාවේ ස්වර්ණමය යුගය හැටියටයි හඳුන්වන්නෙ. මගේ පෞද්ගලික දැක්මට අනුව මේ ස්වර්ණමය යුගය අවසන් වෙලා තියෙන්නෙ බෙලෙක් යුගයකින්. එහෙම කියන්නෙ මම චිත්‍රපට සංස්ථාවෙ අධ්‍යක්ෂ මණ්ඩලයෙ ඉද්දිදි ඒ කියන්නෙ 70 දශකයේදි ප්‍රදර්ශනය නොවී ගොඩගැහිලා තිබුණ චිත්‍රපට ගණන 400 කට වැඩියි. ඒත් කියන්න කනගාටුයි ඒවායින් බහුතරයක් ඒවා ප්‍රදර්ශනය කරන්න පුළුවන් මට්ටමේ ඒවා නෙවෙයි. මේක මහා මුදල් නාස්තියක්. මේක සිනමාවෙ ප්‍රබල කඩාවැටීමක්. මෙහෙම වෙන්න හේතුව සිනමා කලාව ගැන කිසිම අවබෝධයක් නැති පිරිසක් චිත්‍රපට නිර්මානකරණයට අතගසා සිටීම. මට හිතෙන විදිහට මේ ස්වර්ණමය යුගය කියන්නෙ චිත්‍රපට රැසක් නිර්මාණය වී තිබීම නිසා වෙන්න ඇති. මේක ප්‍රමාණාත්මක වර්ධනයක් මිසක් ගුණාත්මක වර්ධනයක් නම් නෙවෙයි.

පසු කාලෙක චිත්‍රපට මණ්ඩල කිහිපයක් ඇරඹුණා. 5 වැනි මණ්ඩලය මින් එකක්. මේ මණ්ඩලය ආරම්භ වීමත් සමග ප්‍රමිතියෙන් උසස් කලාත්මක සිනමා නිර්මාණ බිහිවෙන පසුබිමක් ඇතිවුණා. ඒක ඉතාමත් හොඳ ප්‍රවණතාවක්.

මම චිත්‍රපට සංස්ථාවෙ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් හැටියට ඉද්දිදි මගේ හිතවතුන් බොහෝ දෙනෙක් ඇහුවා ඇයි ඔයා චිත්‍රපට කරන්නෙ නැත්තෙ කියලා. එහෙම කරගත්තොත් ඉක්මනින් ප්‍රදර්ශනය කරගන්නත් පුළුවන්නෙ කියලා. මම ප්‍රතිපත්තියක් හැටියට කොහෙත්ම කැමති වුණේ නෑ ඒ දේ කරන්න.

**චිත්‍රපට කලාවේ, ටෙලි නාට්‍ය කලාවේ වගේම වේදිකා නාට්‍ය කලාවේ අනාගතය ගැන ඔබගේ දැක්ම කෙබඳුද?**

මෑත කාලයේ වඩාත් කලාත්මක චිත්‍රපට, ටෙලි නාට්‍ය රාශියක් බිහිවුණා. ඒක ඉතාමත් සතුටට කාරණයක්. ඒ අතර අවර ගණයේ නිර්මාණත් නොතිබුණාම නෙවෙයි. ඒක ස්වාභාවික දෙයක්. කනගාටුවට කාරණය තමයි මෑත කාලයේ කලාත්මක වේදිකා නාට්‍ය නිර්මාණය වීමේ අඩුවක් තිබීම. සමස්තයක් හැටියට සැලකුවොත් අපේ රටේ කලාවේ අනාගතය ඒ තරම්ම අඳුරු නැහැ. යහපත් බලාපොරොත්තු තියාගන්න පුළුවන් තත්ත්වයක් පෙනෙන බව ඉතාමත් පැහැදිළියි.

**සංවාද සටහන**
**නලුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**




# මනින උපකරණයක් තැනූ අපේ සරසවි දියණිය

අද වන විට දියවැඩියාව බෝ නොවන රෝග අතර මුල් තැනට පත්ව තිබේ. මේ රෝගයේ ස්වරූපය හඳුනාගන්නේ රුධිරයේ දිය වී තිබෙන ග්ලූකෝස් (සීනි) මට්ටම පරීක්ෂා කිරීමෙනි. මෙතෙක් කලක් භාවිත වූයේ මේ ක්‍රමවේදයයි. ඒ වෙනුවට ලොව මුල් වරට අපගේ දහදියවල අඩංගු ග්ලූකෝස් ප්‍රමාණය පරීක්ෂා කිරීමේ තාක්ෂණයක් හඳුන්වා දීමට ශ්‍රී ලාංකේය දියණියක් සමත්ව තිබේ. මේ සඳහා ඇය නිර්මාණය කර ඇති උපකරණය 'ඩයබ්මේට්' **(Diabmate)** නමින් හැඳින්වේ.

මෙහි නිර්මාතෘවරිය නමින් මධූෂි දේවින්දි වැලිකල ය. පාදුක්ක මාදුලාවේ පදිංචි ඇය මූලික අධ්‍යාපනය ලැබුයේ ගොඩගම සුභාරතී විද්‍යාලයනි. 5 වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ ඇය අනතුරුව අධ්‍යාපනය ලැබූයේ කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විදුහලෙනි.


**මධූෂි වැලිකල මෙනවිය**
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2014 වසරේදී ගණිත අංශයෙන් උසස් පෙළ විභාගය සමත් වූ ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයට ඇතුළත් වීමට වරම් ලැබුවාය. මේ අනුව විශ්වවිද්‍යාලයේ පළමුවැනි වසරේදී ගණිතය, සංඛ්‍යාන විද්‍යාව හා පරිගණක විද්‍යාව යන විෂයයන් හැදෑරුවාය. ඉන් අනතුරුව යොමු වූයේ පරිගණක විද්‍යාව කෙරෙහිය. නව නිපැයුම් නිර්මාණය සඳහා ඇයගේ සිත ඇදී ගියේ මෙකලදීය. 'ඩයබ්මෙට්' උපකරණය මේ වෑයමේ වැදගත් ප්‍රතිඵලයකි.

“අපේ තාත්තට දියවැඩියාව තිබුණා. ඒ හින්ද දියවැඩියාව තියෙන කෙනෙකුට මුහුණ දෙන්න වෙන ප්‍රශ්න ගැන මට තිබෙන්නෙ හොඳ අවබෝධයක්. දියවැඩියාව පරීක්ෂා කරන්නෙ ග්ලූකෝමීටර් එකකින් නිවසේදී හෝ රසායනාගාරයේදී රුධිරගත සීනි ප්‍රමාණය පරීක්ෂා කිරීමෙන්. වරින් වර රුධිරය ලබාගන්න වෙන නිසා මේ රෝගීන්ට වේදනාකාරී අත්දැකීමකට මුහුණු දෙන්න සිද්ධ වෙනවා. මේ පරීක්ෂණයට යන වියදමත් අද වෙද්දි බොහොම වැඩියි. මේ කියපු කාරණා ගැන කල්පනා කිරීමෙනුයි දහදියවලින් ශරීරයේ ග්ලූකෝස් මට්ටම පරීක්ෂා කරන්න පුළුවන් උපකරණයක් හදන්න ඕන කියන අදහස මගේ හිතට ආවෙ.” 'ඩයබ්මෙට්' උපකරණය නිර්මාණය කිරීමේ පසුබිම මධූෂි පැහැදිළි කරන්නීය.

විශ්වවිද්‍යාලයේ තුන්වැනි වසරේ ඉගෙනුම ලැබූ කාලයේ **Embedded system and Iot** යන විෂයයෙහි වාර අවසාන ඇගයීම වෙනුවෙන් අදාළ විෂය හා සම්බන්ධ නවතම උපකරණයක් නිර්මාණය කළ යුතු විය. මේ කාලයේදී දහදිය හා රුධිරගත ග්ලූකෝස් අතර සම්බන්ධතාවක් පවතින බවත් සංවේදකයක් භාවිත කර රුධිරය යොදාගැනීමෙන් තොරව රුධිරගත ග්ලූකෝස් මට්ටම මැනගත හැකි බවත් ඇයට ඒත්තු ගොස් තිබුණේය. ඒ සම්බන්ධයෙන් පර්යේෂණ ව්‍යාපෘති ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියාත්මකව තිබුණද ඒවායේ නිරවද්‍යතාව සම්බන්ධව ගැටලු රැසක් තිබිණි. ඇය 'ඩයබ්මෙට්' උපකරණය නිපදවා ඇත්තේ එබඳු ගැටලුවලට විසඳුම් සොයාගැනීමෙන් අනතුරුවය.


42 පිටුවට

කවරයේ කතාව

# කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයෙන් උතුම් සමාජ මෙහෙවරක්








කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ සේවයේ නියුතු අසංක උදාර නම් ආදර්ශවත් තරුණයා, නව මැදගම හෙනානිගල දකුණ මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී දරුවකු වෙනුවෙන් මාසිකව ශිෂ්‍යත්වයක් පිරිනැමීමට මුලපුරා සිටියේය.

මේ විදුහලේ අකුරු කරන්නේ ආදිවාසී දරු දැරියන්ය. මොවුන් ලෝකයෙන් වසං වී හුදෙකලා ජීවිත ගතකරන පිරිසකි. එසේ වුවත් ගුරු මණ්ඩලයේ කැපවීම උපරිම ය. දක්ෂතා සපිරි දරු දැරියෝ රැසක් මෙහි වෙති.

"මේ ඉස්කෝලෙ අපෙන් ඉල්ලීමක් කරල තිබුණ පුළුවන්කමක් තියෙනවනං සංගීතයට දක්ෂ ළමයෙක් වෙනුවෙන් වයලින් එකක් අරං දෙන්න කියලා. පස්සෙ අපෙ කණ්ඩායමේ අයයි අපිත් එක්ක වැඩ කරල පිටරට ගිය කණ්ඩායමකුයි මුදල් යොදවල වයලින් එකකුයි ළමයින්ට පොත් ටිකකුයි අරං ඒ දරුවන්ගෙ අතටම දෙන්න අපි එහෙ ගියා." කෝට්ටේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයේ කාර්ය භාර නිලධාරී බුද්ධික ගලගෙදර මහතා පැවසීය.

මේ ගමන ගියේ 2023 අවුරුද්දේ ජනවාරි මාසයේදීය. ගුරු මණ්ඩලය වයලීනය හා පොත් පත් භාරගන්නට කෙටි උත්සවයක් සංවිධානය කළේ කෝට්ටේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකයට තුති පිදුමටය.

එදා මහා වැස්සක් ඇදහැලුණේය. 1 වැනි හා 2 වැනි වසරවල දරුවන්ගේ පන්ති කාමර තෙමෙන්නට විය. වැස්සෙන් බේරෙන්නට ඔවුහු වෙනත් ගොඩනැගිල්ලකට දිව ගියහ. ඒ ගොඩනැගිල්ලේ වහලයද හොඳටම අබලන්ය. පුස්තකාලය පිහිටියේ ඒ ගොඩනැගිල්ලේ කොටසකය.

මේ බව දන්වා අදාළ කලාප අධ්‍යාපන බලධාරීන්ට විදුහල්පතිවරයා කිහිප වරක් ලිඛිතව දැන්වීය. නමුත් එලක් නොවීය.

"මේ අවුරුද්දේ (2023) අවසන් වෙන්න කලින් මේ වහල අබලන් ගොඩනැගිලි කලාපයෙන් හදල දුන්නෙ නැත්නම් අපි හදල දෙනව කියල පොරොන්දු වෙලා ආවා. පස්සෙ අලුත් විදුහල්පතිවරයෙක් ඇවිත් තිබුණා.



**පාසල් ගොඩනැගිල්ලේ වහලය පිළිසකර කරමින්**



30 පිටුවට



පාසල් දරුවන්ට ගිනි නිවීම් පුහුණුව ලබාදෙමින්

ඔහු නොවැම්බර් මාසෙදි අපිට දැන්වුවා ගොඩනැගිල්ල කලාපයෙන් හදල දුන්නෙ නෑ කියලා. උදවුවක් කරන්න පුළුවන් නම් බොහොම වැදගත් වේවි කියලා.” ගලගෙදර මහතා පැවසීය.

කෝට්ටේ මහා නගර සභා ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය හා ඉංගිරිය සිතුජය මිතුරු සංසදය මේ කටයුත්ත ඉටුකර දෙන්නට පෙරමුණ ගත්තේය. ඇස්තමේන්තුගත වියදම රුපියල් ලක්ෂ 3 ක් පමණ විය. සිතුජය මිතුරු සංසදයෙන් රුපියල් ලක්ෂ 1 1/2 ක්ද ගිනි නිවීම් ඒකකයෙන් ඉතිරි ලක්ෂ 1 1/2 ද එක්කාසු වුයේය. විදෙස්ගත වුවන් කිහිප දෙනෙක්ද මේ පින්කමේ හවුල්කරුවෝ වූහ.

“අපි දවස් දෙකක් වහලෙ හැදුවා. වැඩේට සිතුජය මිතුරු සංසදයේ කණ්ඩායමකුත් එකතු වුණා. අපි වෙල්ඩින් වැඩ කරන්න දෙන්නෙකුත් එක් කරගෙන ගියා. එයාලා පාසලේ කැඩී බිඳී තිබුණ ඩෙස්ක් පුටු සේරම හැදුවා. සිතුජය මිතුරු සංසදය වඩු වැඩ කරන අය පස්දෙනෙක් එක් කරගෙන ආවා. දවස් දෙකක් බොහොම කැප වීමෙන් වහලය අලුත්වැඩියා කළ ඔවුන් අපෙන් සත පහක්වත් අය කළේ නෑ. ඒක මිල කරන්න බැරි සේවයක්. අපේ ගිනි නිවීම් ඒකකය ඔවුන් වෙනුවෙන් උපහාරයක් පැවැත්වුවා.” ගලගෙදර මහතා කීවේය.

තමන් කරන උදවු වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවූ කෝට්ටේ මහා නගර සභා ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය දවස් දෙක තුනකට කෑම බීම සකසාගැනීමට උවමනා කළමනා සියල්ල රැගෙන ගියේය. නමුත් ඒ දෙදින තුළ දරුවන්ගේ දෙමවුපියෝ තම දරුවන්ට නොතෙමී සිටින්නට වහලයක් සාදා දෙන පිරිස උදෙසා උදෑසන 7 වනවිට කෑම බීම සකසාගෙන ආවෝය. විදුහල්පතිවරයා ප්‍රමුඛ ගුරු මණ්ඩලයද හැකි උපරිම මට්ටමෙන් මේ පිරිසට සංග්‍රහ කළහ.

“මේ සංග්‍රහ නිසා අපි උයන්න පිහින්න අරං ගිය දේවල් ඔක්කොම ඉතුරු වුණා. දෙවැනි දවසෙ වහලෙ වැඩේ ඉක්මනට ඉවර වුණා. එදා දවල් අපි ළඟ තිබුණ දේවලට තවත් දේවල් ගෙනැවිත් උයලා එතන හිටපු සීයකට විතර අපි කන්න දුන්නා.” ගලගෙදර මහතා පැවසීය.

නැටුමට දක්ෂ දරු දැරියන් කිහිපදෙනෙක්ද වෙති. ඒ ඇතැමුන් සමස්ත ලංකා තරගවලට ඉදිරිපත් වී ජය ගත්තවුන්ය. මේ ජයග්‍රහණයන්හි ජවය වන්නේ පාසලේ නැටුම් ගුරුවරිය වන දයා අබේසූරිය මහත්මියයි. ඇය අපමණ කැපවීමකින් රාජකාරිය කරන්නියකි. ඇයගේ ඉල්ලීම මත නර්තනයේ යෙදෙන දරු දැරියන් වෙනුවෙන් රූපලාවන්‍ය කට්ටලයක් **(Makeup set)** පරිත්‍යාග කිරීමටද මේ කණ්ඩායම අමතක නොකළේය. එහි වටිනාකම රුපියල් 25000 ක් පමණ විය.

ඉංගිරියේ විජය ෆාමසි හි භාෂිත නිලුපුල් නම් 26 හැවිරිදි තරුණයාගේ මවුපියන් මියගොසිනි. ඔවුන්ට පින් පිණිස තම පුද්ගලික මුදලෙන් මේ පාසලේ 1 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන දරු දැරියන් 30 කට අවශ්‍ය පාසල් උපකරණ කට්ටල පරිත්‍යාග කළේය.

මේ පාසල් දරු කැළ වෙනුවෙන් ගිනි නිවීම පිළිබඳ පුහුණුවක් ලබාදෙන්නටදවී කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය අමතක නොකළේය.

“නාගරික පාසලක දරුවන්ට දෙන පුහුණුව මේ දරුවන්ට දෙන එකේ තේරුමක් නැ කියල අපිට හිතුණා. මේ සමහර ගෙවල්වල ගෑස් පාවිච්චි කරනවා.



පාසල් අබලන්ව තිබූ සියලු ඩෙස්ක් පුටු අලුත්වැඩියා කෙරිණි



31 පිටුවට

ගෑස් සිලින්ඩරයක් ගිනි ගත්තොත් ගෙදර තියෙන දේවල් පාවිච්චි කරල ගිනි නිවන විදිම කියල දුන්නා. තව, හේනක් ගිනි ගත්තොත්, ලැව්ගින්නක් ඇතිවුණොත් නිවන හැටි වගේම සත්තු ගින්නට අහුවුණොත් බේරගන්න හැටිත් කියල දෙන්න අපි අමතක කළේ නෑ." ගලගෙදර මහතා විස්තර කළේය.

හෙනානිගල දකුණ නව මැදගම මහා විද්‍යාලය පිහිටා තිබෙන්නේ මාදුරු ඔය ජාතික වනෝද්‍යානයේ සිට කිලෝමීටර 5 ක් පමණ දුරිනි. මේ පාසලේ ඉගෙනුම ලබන්නේ සිසු දරු දැරියන් 263 කි. ගුරු මණ්ඩලය 19 කි. විදුහල්පතිවරයා ප්‍රමුඛ ගුරු මණ්ඩලයේ අසීමිත කැපවීම ඉතාමත් අගය කළ යුතුය. ඔවුහු රැකියාව ඉක්මවා ගොස් උත්කෘෂ්ඨ මෙහෙවරක නිරත වන්නෝය.



මෙම පාසලෙන් බිහි වූ ජාතික මැරතන් ශූරයා වූ (2022) පී. ඩබ්ලිව්. රත්නපාල සිසු දරුවා

මවුපියන් ආදිවාසීන් වූ දරුවන්ට ඉගෙනීමට ඔවුන්ගෙන් සැලකිය යුතු සහයෝගයක් දෙන්නට තරම් ඔවුන්ට උගත්කමක් නැත. ඔවුන් එදා වේල පිරිමසාගන්නේ ගොවිතැනින් හෝ දඩයමිනි.

"අපි දෙන ගෙදර වැඩ මේ දරුවො වැඩි දෙනෙක් කරගෙන එන්නෙ නෑ. මම හොයල බැලුව ඇයි කියලා. උගත්කමක් නැති දෙමවුපියො මේ ළමයින්ව දඩයමටයි ගොවිතැනටයි යොදවා ගන්නවා. මේ දෙමවුපියො හරිම දුප්පත්. ඒ අයගෙ තත්ත්වය හරිම කනගාටුදායකයි. ඒත් ඒ හින්ද දරුවො අනාථ වෙනව බලං අපිට ඇහැ කන පියාගෙන ඉන්න බෑනෙ. මම මේකට වැඩපිළිවෙළක් යෙදුවා. පාසල 1.30 ට අවසන් වෙලා ගෙදර ගිහිං කෑම කාලා ආයෙත් 2.00 වෙද්දි පාසලට ඇවිත් හවස 4.00 වෙනකම් පාසලෙන් දෙන ගෙදර වැඩ කරවන්න පටන්ගත්තා. ගුරු මණ්ඩලයත් දරුවන් වෙනුවෙන් තමන්ගෙ අමතර කාලයක් කැප කරලා දරුවන් වෙනුවෙන් වෙහෙසෙන්නේ ලොකු කැපවීමකින්." සිසු දරුවන්ට සැබෑ ගුරු පියකු වූ විදුහල්පති ඊ. එම්. එම්. ජී. ජයන්ත විදිරිසිංහ මහතා කීවේය.

මේ පාසලෙන් බිහිවූ දක්ෂයින් කිහිපදෙනකු පිළිබඳ සඳහන් කළයුතුමය. මැරතන් තරගාවලියකින් ජාතික ශූරතාව (2022) දිනාගත් ඩී. ඩබ්ලිව්. රත්නපාල සිසුවා හා පද්‍ය ගායනාවලින් සමස්ත ලංකා ජයග්‍රහණයක් අත්කරගත් ඩී.එම්. සුගන්ධිකා දිසානායක සිසුවිය ඒ අතර සුවිශේෂීය.

"මේ පාසලේ සමහර දරුවො නැටුමට බොහොම දක්ෂයි. ඒ වගේම ඒ අයට ආවේණික නැටුම් වර්ගත් තියෙනවා. ඉතින් මේ දරුවන්ට හොඳින් නැටුම් උගන්වලා කලා ආයතනයකුයි සංස්කෘතික මධ්‍යස්ථානයකුයි පටන්ගන්න මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා. එහෙම කළොත් මේ පළාතෙ උත්සවවලට නැටුම් ඉදිරිපත් කරලා ඒ වගේම මාදුරුඔය රක්ෂිතය නරඹන්න එන විදේශිකයන්ට නැටුම් පෙන්වලා මේ දරුවනට අමතර ආදායමක් උපයාගන්න මාර්ගයක් පාදල දෙන්නයි මගේ බලාපොරොත්තුව. තවත් දෙයක් තමයි මම හිතනව මේ හිත් සෞන්දර්යයට යොමුවුණොත් මේ ළමයි දඩයමිනුත් ඈත් වෙයි කියලා." මේ අහිංසක දරු දැරියන්ගේ හෙට දවස එළිය කරන්නට අපමණ වෙහෙසෙන විදුහලේ නර්තන ගුරුවරිය වන දයා අබේසූරිය මහත්මිය පැවසුවාය.

කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීම් හා ජීවිතාරක්ෂක ඒකකය මෙන් ඔබත් මේ දුෂ්කර දුඃඛිත ජීවිතයක් ගතකරන අහිංසක දරුවන් වෙත උදවුවක් උපකාරයක් කිරීමට කැමැත්තක් දක්වන්නේ නම් එහි විදුහල්පතිවරයා අමතා (දුරකථන අංකය 071 712 2671) අවශ්‍යතාවන් විමසා බලන මෙන් මානව දයාව සපිරි ඔබගෙන් ඉල්ලා සිටින්නෙමි.

කෝට්ටේ ගිනිනිවීම් ඒකකයේ සාමාජිකයින් සහ විදුහල්පතිතුමා ප්‍රමුඛ ගුරු මණ්ඩලය


**නලුන් අමන්ද**

**කලා කෙත**

# 'විජය' ජීවිත කතාව සිනමාවට





1988 පෙබරවාරි 16 වනදා වෙඩි තබා ඝාතනය කළ ජනකාන්ත සිනමා නළු විජය කුමාරණතුංගයන්ගේ ජීවන චරිතය අළලා දැවැන්ත චිත්‍රපටයක් නිර්මාණය වෙමින් පවතී. ඉන්දියාවේ සුප්‍රකට ලයිකා සමාගම විසින් නිෂ්පාදනය කර කරන 'විජය' චිත්‍රපටයෙහි විජයගේ චරිතය රඟපාමින්, එය අධ්‍යක්ෂණය කරනුයේ රන්ජන් රාමනායක විසිනි. ලයිකා සමාගමේ අධිපති එස්. සුබාස්කරන් සහ රන්ජන් රාමනායක අතර එකඟතා ගිවිසුම් පසුගිය ජනවාරි මාසයේදී අත්සන් කෙරුණු අතර මේ වන විට චිත්‍රපටයේ වැඩ කටයුතු ආරම්භ වී ඇත.

## 'වර්ණ' වැඩ අවසන්



කවියෙකු, කෙටිකතාකරුවෙකු සහ චිත්‍ර ශිල්පියෙකු වන අජිත් පී. ධර්මසූරියගේ කුළුදුල් සිනමා නිර්මාණය 'වර්ණ' චිත්‍රපටියේ වැඩ කටයුතු අවසන් වී ඇති අතර එහි විශේෂ දර්ශනයක් පසුගියදා පැවැත්විණි.

ඉහළ මධ්‍යම පාන්තික චරිත හතරක් යොදා ගනිමින් මනුෂ්‍ය ජීවිතයේ අඳුරු අහුමුලුවල යථා ස්වභාවය සිනමානාත්මකව ස්පර්ෂ කළ මෙම සිනමා කෘතියෙහි ප්‍රධාන චරිත සඳහා විශ්ව කොඩිකාර, චමත්කාර ලක්මිණි, ලක්ෂ්මන් මෙන්ඩිස් සහ ජයනි සේනානායක පණ පොවති. අධ්‍යක්ෂවරයාගේ කාර්යය සාර්ථක චලන සිතුවමක් බවට පත්කිරීමෙහිලා රුවන් කොස්තාගේ කැමරාකරණය ඉමහත් පිටුවහලක් වී ඇත.

මෙම සිනමා පටය ලබන මැයි මාසයේදී පමණ රිද්ම මණ්ඩලයේ සිනමාශාලාවල ප්‍රදර්ශනය වීමට නියමිතය.

## සුදත් මහදිවුල්වැව ගේ MY RED COMRADE වැඩිහිටියන්ට පමණයි

සුදත් මහදිවුල්වැවගේ අධ්‍යක්ෂණය කළ නවතම සිනමා කෘතිය MY RED COMRADE මෙරට ඡන්දය හිමි අවුරුදු 18 වැඩි වැඩිහිටියන් නැරඹිය යුතු සිනමා කෘතියක් ලෙස ප්‍රකාශයට පත්වී ඇත.

පසුගියදා මෙම චිත්‍රපටය නැරඹූ වාරණ මණ්ඩලය විසින් මෙම තීරණය ගෙන ඇත.

චිත්‍රපටය ඉදිරි මාසය තුළ ප්‍රදර්ශනය සඳහා සියල්ල සූදානම් කර ඇත.

**පාඨක ඔබගේ ප්‍රදේශයේ කලාව හා සම්බන්ධ තොරතුරු මේ පිටුවේ පලකිරීමට අප වෙත එවන්න**

# බටහිර සිනමාව




කිසිදු විවාදයක් නැහැ. 2023 වසරට අදාළව නැරඹූ හොඳම Biography ) Sport ශානරයේ චිත්‍රපටය විදියට **'The Iron Claw'** නම් කරන්න පුළුවන්. මෙවැනි ගණයේ විශිෂ්ට චරිතාපදාන චිත්‍රපටයක් ඔස්කාර් සම්මානය වෙනුවෙන් එකදු නිර්දේශ නාමයක් හෝ ලබා නොගත්තේ ඇයිද යන්න පිළිබඳ තියෙන්නෙ දැඩි ප්‍රශ්නාර්ථයක්. ඒ කෙසේවෙතත් බලාපොරොත්තුසහගත චිත්‍රපටයක් විදියට සත්‍ය කතාවක් පෙරදැරිකරගෙන නිර්මාණය වුණු**'The Iron Claw'** චිත්‍රපටය කේන්ද්‍ර වන්නේ 1970 - 1790 දශකයේ ඇමරිකානු වෘත්තිමය මල්ලවපොර ක්‍රීඩකයකු වන .කෙවින් වොන් එරික් සහ ඔහුගේ මල්ලවපොර ක්‍රීඩා පවුල වටායි. ඇමරිකානු **National Board of Review** ආයතනය විසින් 2023 වසරේ හොඳම චිත්‍රපට දහය අතරට **'The Iron Claw'** නම් කළේය. ඒ **'The Iron Claw'** චිත්‍රපටය එතරම්න්ම විශිෂ්ට බවයි ඔවුන්ගේ අදහස. එය සැබෑවකි. අද්විතීය ගණයේ ක්‍රීඩා පවුලක සිනමාත්මක නිරූපණය යථාර්ථයට ප්‍රේක්ෂකයා සමීප කරවන්නේ ඉතාම සංවේදීව ය.

චිත්‍රපටය අධ්‍යක්ෂණය කරන්නේ **Sean Durkin** විසිනි. චිත්‍රපටය නිෂ්පාදනය කරන්නේ ලොව සුප්‍රකට සිනමා සමාගමක් වන **'BBC FILMS'** සමාගම විසිනි. ලොව පුරා බෙදාහැරීම සිදු කරන්නේ සම්මානනීය චිත්‍රපට නිර්මාණය කරන්නට උපන් හපන් **'A24'** සිනමා සමාගම සහ .ලයන්ස්ගේට් ෆිල්ම්ස්. විසිනි. චිත්‍රපටය රංගනයන් ඔපවත් කරන්නේ හොලිවුඩයේ දක්ෂ නළු නිළියන් පිරිසකගේ නිරූපණයෙනි. ඒ **'Zac Efron''** **'Jeremy Allen White''** **'Harris Dickinson''** **'Maura Tierney''** **'Holt McCallany'** සහ **'Lily James'** විසිනි.

ඇමරිකානු රෙස්ලිං ක්‍රීඩාව තුළ නොමැකෙන සටහනක් තැබූ කෙවින් වොන් එරික් සහ ඔහුගේ පුත්‍රයන් තිදෙනා විසින් ලෝක හෙවිවේට් ශූරතාවය වෙනුවෙන් තම දිවියේ හොඳම අඩවිය කැප කරන ආකාරයත්, කුටුම්භය තුළ සිදුවන අභ්‍යන්තර ගැටුම් පිළිබඳවත් **'The Iron Claw'** අන්තර්ගත වෙනවා. ක්‍රීඩකයකුගේ වෘත්තීයමය අරමුණු සමඟ ගැට ගැසුණු පෞද්ගලික දිවිය විසින් ඔහුට එල්ල කරන බලපෑමත්, අටෝරාසියක් කරදර, බාධක මැද ජයග්‍රහණයන් හඹා යෑම කෙතරම් අසීරු ද යන්න චිත්‍රපටය සාකච්ඡාවට ලක් කරනවා. මල්ලවපොර වළල්ල තුළ සේම ගෘහස්ථව ද එරික් සහෝදරයන් විසින් ඇති වන ගැටුම් සංවේදීව ඉදිරිපත් කරනවා. කිසිවිටකත් දරාගත නොහැකි පවුලක සිදුවන ඛේදජනක සිදුවීමක් පිළිබඳ කියාපාන **'The Iron Claw'** චිත්‍රපටය ඔබ අනිවාර්යයෙන්ම නැරඹිය යුතුම සිනමාපටයකි. දෛවය මෙතරම් අකාරුණික වූයේ ඇයිද? ඔබ ප්‍රශ්න කරනවා නොඅනුමානයි.

**මලින්ත විතානගේ**
**පරිපාලක – 'සිනමා සයුර' ෆේස්බුක් සමූහය**

# පත්තරකාරයෝ

## ගැන එදා නළු නිළියෝ කිව්වෙ මෙහෙමයි

වැඩි හරියක් කපුටෝ...

**ගාමිණී ෆොන්සේකා**

මොවුන් අතර අගතියෙන් තොර පුද්ගලයන් සෙවීම ගජමුතු සොයන්නාක් වැනිය.

**ජෝ අබේවික්‍රම**

අපොයි... අපොයි අන්තිම සවුත්තු ජාතියක්. ඒගොල්ලො හින්ද අද අපිට කටක් උස්සන්න බෑ. වචනයක් වරදින්ඩත් බැහැ.

**ශාන්ති ලේඛා**

පණ බය ජාතියක්. ඒ වෙන මොකවත් නිසාවත් නොවෙයි. අපි කියනවා කියා හිතලවත් නැති කුණුහරප පත්තරවල දාන නිසා. නමුත් පත්තරකාරයින් අපිට ඉතාම අවශ්‍ය කොට්ඨාසයක්. අපේ වෘත්තියට ලොකු සේවයක් ඒ අයගෙන් ඉටුවෙනවා.

**ජෙනිටා සමරවීර**

# රම්‍යා සමුගනී



ගුවන් විදුලිය, වේදිකාව, සිනමාව හා පුංචි තිරය දිග්විජය කළ රම්‍යා වනිගසේකර පසුගියදා අප අතරින් සදහටම සමුගත්තාය. කලක් අසනීප තත්ත්වයෙන් සිටි ඇය කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මෙලොව හැර යන විට 73 වන වියෙහි පසුවූවාය.

ගුවන් විදුලියේ සිටි ප්‍රවීණ හා දක්ෂතම නිවේදිකාවක වූ රම්‍යා වනිගසේකර වේදිකාව, සිනමාව හා ටෙලි නාට්‍ය තුළ ද සිය රංගන ප්‍රතිභාව ප්‍රකට කළාය. ඇය ජනතාව අතර මුලින්ම වඩාත් ජනප්‍රියත්වයට පත්වන්නේ ආර්. ආර්. සමරකෝන් ගේ කැළණි පාලම වේදිකා නාට්‍යයේ මැටිල්ඩා ගේ චරිතය තුළිනි. අඛණ්ඩව දශක හතරක් පමණ ඇය මේ චරිතයට පණ පෙව්වාය.

කෑගල්ල කොටියාකුඹුරේ දී සහෝදර සහෝදරියන් හත් දෙනෙකුගෙන් යුත් පවුලක උපත ලබන රම්‍යා, කොටියාකුඹුර අම්පේ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා රුවන්වැල්ල රාජකීය විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කළාය. 1976 දී රංජිත් ධර්මකීර්ති ගේ 'හස්තිරාජ මහත්තයා' වේදිකා නාට්‍යයේ සුළු චරිතයක් රඟපාමින් ප්‍රසිද්ධ වේදිකාවට පිවිසෙන ඇය ඉන් පසු 'අංගාරා ගඟ ගලා බසී' නාට්‍යයේ පසුබිම් ගීත ගායනයටද එක් වූහ. ඒ ප්‍රේමසිරි කේමදාසයන්ගේ සංගීතය අධ්‍යක්ෂණය යටතේය. ඉඩම, අහසින් වැටුණු මිනිසුන්, ජේලර් උන්නැහැ, දූවිලි, රජ කතාව, සඳ කිඳුරු, මුදු පුත්තු, මා හේනේ රීරි යකා, ලියතඹරා, සිරිසඟ බෝ, හිරු නැති ලොව ආදී වේදිකා නාට්‍යවලද ඇය රඟපෑවාය. කන්දේ ගෙදර, පළිඟු මැණිකේ, මැණික් නදිය ගලා බසී, දෙනුවර මැණිකේ, පබා, අලුත් ගෙදර, යර්ස් බොස් ආදී ටෙලිනාට්‍ය ඇය චරිත නිරූපනය කළ අමතක නොවන නිර්මාණ අතර වේ. 1981 සිට 2006 විශ්‍රාම යන තෙක් ඇය ගුවන් විදුලියේ ස්ථිර නිවේදිකාවක් ලෙස ද කටයුතු කළාය. ඇයගේ අභාවය පිළිබඳ 'ශ්‍රී පුර' ශෝකය මෙසේ සටහන් කරමු. ඇයට නිර්වාණ සුවය අත්වේවා.

# තිරෙන් පිටුපස සිනා



ගම් පෙරළිය චිත්‍රපටය රූ ගත කරන අවස්ථාවේ බලපිටියේ මහා කප්පින වලව්වේ දී කයිසාරුවත්තේ මුහන්දිරම් මියයන මොහොතේ දර්ශනය රූගත කරද්දී අධ්‍යක්ෂ ලෙස්ටර් ජේම්ස් පීරිස්ගෙන් බැනුම් ඇසූ මොහොතක් ගැන ට්‍රිලීෂියා ගුණවර්ධන පැවසූ කතාවක් සරසවිය පුවත්පතට ඒ.ඩී. රංජිත් කුමාර ලියනවා.

ඒ දර්ශනය ශෝකී අවස්ථාවකි. අනුලා ලෙස රඟපෑ ට්‍රිලීෂියා තම පියා ලෙස රඟපෑ ඩේවිඩ් ධර්මකීර්තිගේ පපුවට පහනේ එළියෙන් බුලත් කොළයක් නවා සිද්ධාර්ථ තෛලය තවයි.

චරිතයේ හැටියට පණ අදිමින් සිටින නළු ඩේවිඩ් තමා අසල සිටින දූවරුන් දෙදෙනා ලෙස රඟන පුණ්‍යා හා ට්‍රිලීෂියාට හෙමින් මෙසේ කියා ඇත.

තව පල්ලෙහාට තවපල්ලා එතකොට පණ එයි.

පුණ්‍යාටත්, ට්‍රිලීෂියාටත් සිනහව නතර කරගත නොහැකි විය.

අයියෝ...මේ ශෝක අවස්ථාවක් මොකද හිනා වෙන්නෙ..?

ලෙස්ටර් කියා ඇත්තේ තරමක කේන්තියෙනි.

පසුව සිනහව මැඩගෙන ඒ ශෝකී අවස්ථාව නිරූපණය කිරීමෙන් පසු දෙදෙනාම ලෙස්ටර් මහතා අසලට ගියහ.

හොඳට සීන් එක ආවා මොකද වුණේ හිනා යන්න තරම්...

සොරි මිස්ටර් පීරිස්...ඩේවිඩ් මහත්තයා මැරෙන ගමන් කොලොප්පන් කළා..

Henry Warnakulasuriya ගෙනි.

කලා කෙත



# යුගයක් ඔප්වත් කළ සුන්දර කලාවක් ඉහළටම ඔසවා තබන්නට දිවියම කැප කළ

# තලංගම ජයසිංහ

එදා මෙරට බහුතරයක් ජනතාවගේ ප්‍රධාන විනෝදාස්වාද මාධ්‍යය බවට පත්ව තිබූ සිනමාව තරමටම ජනප්‍රියත්වයට පත් මාධ්‍යයක් වූයේ චිත්‍රකතාවයි. හැත්තෑව දශකයේ මැද භාගය වන විට ජනප්‍රියත්වයෙන් සිනමාව හා තරමටම චිත්‍රකතාව ද සම තත්ත්වයේ තිබිණි. ලාංකේය චිත්‍රකතාව මෙසේ ජනප්‍රියත්වය කරා පැමිණි ගමනට එහි ආරම්භක දශකය වූ පනහේ දශකයේ චිත්‍රශිල්පීන් ඉටුකළ කාර්යභාරය අමතක කළ නොහැකිය. ලාංකේය චිත්‍රකතාවේ පුරෝගාමියා වූ ජී. ඇස්. ප්‍රනාන්දු සමග සුසිල් ප්‍රේමරත්න, පුරවිජය ෆොන්සේකා වැන්නවුන් එතෙක් ඉටුකරමින් සිටි කාර්යභාරයට කර උර දෙන්නට තවත් නව යොවුන් චිත්‍රශිල්පියෙක් ක්ෂේත්‍රයට එක්විය. ඒ එවකට 19 හැවිරිදි වියේ පසුවූ තලංගම ජයසිංහ ය. එවක පටන් මියයන තුරුම මේ සුන්දර කලාව ඉහළටම ඔසවා තබන්නට දශක හතක් පුරාවට ඔහු ඇප කැපවීය.

ජෝර්ජ් ඇල්බට් ජයසිංහ හා එම මැතිණියට දාව 1936 ජූලි 5 වනදා තලංගම ග්‍රාමයේ උපත ලද ඔහුගේ මුල් නම වූයේ ජෝර්ජ් එඩ්මන් ජයසිංහ ය. යන්තම් වයස අවුරුදු 3 සම්පූර්ණ වීමත් සමගම හෙතෙම පාසල් අධ්‍යාපනය ආරම්භ කළේ බත්තරමුල්ල පැලවත්තේ විද්‍යාවර්ධන බෞද්ධ මිශ්‍ර පාසලෙනි. අධ්‍යාපන කටයුතුවලට අමතරව කවියටත් චිත්‍ර ශිල්පයටත් දස්කම් දැක්වූ තලංගම ජයසිංහයන් තමන්ගේ මේ නිර්මාණ ‘ළමා ලෝකය’ ඇතුළු ළමා සඟරාවලට යොමු කළේය. ඒවා සියල්ලම පාහේ, තලංගම තිලක ජයසිංහ යන නමිනි. මෙසේ සඟරාවලට යොමු කළ නිර්මාණ දිගටම පළවීම චිත්‍ර කලා කටයුතු කිරීමට ඔහු තවත් උනන්දු කරවන්නට ඇත. ඔහු අපොස සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලැබීමෙන් අනතුරුව රජයේ ලලිත කලා ආයතනයට පස් අවුරුදු පාඨමාලාවක් සඳහා ඇතුළත් විය. ඒ 1951 වර්ෂයේදී ය. චිත්‍ර ශිල්පයට සහජයෙන්ම උරුම හැකියාවක් සහිත මේ සිසුවාගේ දක්ෂතාවය දුටු ආයතනයේ ගුරුවරු ඔහුට උසස්වීම් දෙකක් ලබා දුන්හ. ඒ වාර දෙකකදී පන්තියක් පසුකර පන්තියකට යාමට ඉඩ සලසා දෙමිනි. චිත්‍ර, මැටි, මූර්ති හා ලාකඩ විෂයන් හතරම හොඳින් සම්පූර්ණ කළ ඔහු එහිදී නිවාස සැලසුම් පිළිබඳව ද උගත්තේය. තමන්ගේ නිවස ගොඩනැගුවේද තමන්ගේ සැලසුමකට අනුව බව පසු කලෙක ඔහු පවසා තිබිණි. පසුව වැඩි දුරටත් චිත්‍ර විෂය හැදෑරීම සඳහා මරදානේ ටෙක්නිකල් කොලීජියට ඇතුළත් විය.

මේ කාලය තුළ ඔහු තමාගේ සහ පාසල් යන වයසේ සිටි නංගිලාගේ අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය මුදල් සොයා ගනු වස් වෙළෙඳ දැන්වීම් ප්‍රචාරක ආයතන දෙකක පමණ සේවය කළේය. ඒ රුපියල් 125 හා 150


36 පිටුවට

ක වැටුපකට ය. ඒ අතරතුර චිත්‍රකතා නිර්මාණය කරමින් පුවත්පත් ආයතන වෙත යැවීය. එසේ යවන ලද චිත්‍රකතාවක් 1954 දී දිණමිණ පත්‍රයේ පළවිය. ඒ 'චිත්‍රා' නම් චිත්‍රකතාව යි. ඒ වන විට ඔහුගේ වසය අවුරුදු 18 කි.

එක්සත් ප්‍රවෘත්ති පත්‍ර ආයතනයේ 'සිළුමිණ' පුවත්පත සඳහා චිත්‍ර ශිල්පියකු අවශ්‍ය බවට පළවූ දැන්වීමක් දැකීමෙන් ඒ සඳහා ඉල්ලුම්පතක් යොමු කරන තලංගම ජයසිංහට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ 400 ක් අයදුම්කරුවන් අතරින් ඔහුව තොරාගැනිණි. ඒ අනුව 1954 දී ලේක්හවුස් ආයතනයට පැමිණෙන ඔහු 1957 දී ස්ථිර සේවකයකු ලෙස පත්වීම් ලද්දේය.

තමාගේ උප්පැන්න සහතිකයෙන් හිමි ජෝර්ජ් එඩ්මන් ජයසිංහ යන නමට හෙතෙම කවදත් කැමැත්තක් නොදැක්වීය. පියාණන්ගේ අභාවය සිදුවූ 1955 වර්ෂයේදීම ඔහු පියාණන් විසින් ඔහුට තැබූ නමද වෙනස් කළේය. "මට අවශ්‍ය වුණේ අන්‍යයන් අතර කැපී පෙනෙන විදිහේ නමක් නොවෙයි. භාවිතයට පහසු කටට හුරු සිංහල නමක් ඒ නිසා ඒ නිසයි ඉංග්‍රීසි පන්නයේ නම වෙනස් කර තලංගම ජයසිංහ නම යොදා ගත්තේ'' ජෝර්ජ් එඩ්මන් ජයසිංහ තලංගම ජයසිංහ වූ හැටි ගැන එතුමන් වරක් එසේ පවසා තිබිණි. තම උපන් ගමේ නමින් ප්‍රචලිත වූ කලාකරුවන් අතලොස්ස අතර තලංගම ජයසිංහ වඩාත් ජනතාව අතර ප්‍රචලිත් වූයේ ලේක්හවුස් ආයතනයේ ප්‍රකාශන තුළින් ඔහු ඉදිරිපත් කළ නිර්මාණ නිසාවෙනි. ලේක්හවුස් ආයතනයේ ප්‍රකාශන තුළින් ඔහු ඉදිරිපත් කළ චිත්‍රකතා නිර්මාණ රැසකි. ඒ අතරින් මිනිස් දඩයම, ඇටසැකිල්ල, සෙනෙහසක කඳුළු, සුදු සහ කළු, රතු අක්කා, පර්සියස්, ඊරෝස්, ලොකු තාත්තා, නෝනා ලීසා, වියරු මුහුද, කල්හාරී, ජැකී සහ විකී, වීරියස්, හීරා, යකඩ ගෑනි, පියුමලී නිල් කඟවේනා, සැන්දෑ අහස වගේ, හිරු නැති ලොවක් වඩාත් ජනප්‍රිය විය. චිත්‍රකතාවලට අමතරව ඔහු නිර්මාණය කළ සන්නිදර්ශන චිත්‍ර, කාටුන් චිත්‍ර එම අයාතනයේ ප්‍රකාශනවලට නවමු මුහුණුවරක් එක්කළේය. තවද සිළුමිණ පුවත්පතට ඔහු ඉදිරිපත් කළ සුනබ දේශය, හා විනෝද වටය යන විශේෂංගද සරසවිය සිනමා පත්තරයට කළ විලම්බීත හා කුරුමිණි සදෙස විශේෂාංගද එකළ පාඨකයන් අතර බෙහෙවින්ම ජනප්‍රිය විය.

එදා දේශපාලන ලෝකයේ බෙහෙවින්ම කතා බහට ලක්වුණු විවිධ චරිත, මෙන්ම සමාජයේ කැපී පෙනෙන පුද්ගලයන්ගේ කැරිකේචර් චිත්‍ර ඉතා සුළු පින්සල් පහරවල් කිහිපයක් පමණක් උපයෝගී කර ගෙන කාටත් හඳුනාගත හැකි ලෙස ඇඳීමට තලන්ගම ජයසිංහ දක්වන දක්ෂතාවය පුදුම සහගතවේ. එසේ ඇඳි චිත්‍ර කිහිපයක් මෙහි පළවේ.



තලංගම ජයසිංහ ගේ චිත්‍රකතා දෙකක් සිනමාවට ද නැගී ඇත. වියරු මුහුද ඇසුරින් එච්. ඩී ප්‍රේමරත්න අධ්‍යක්ෂණය කළ 'සප්ත කන්‍යා' සහ 'ලොකු තාත්තා' ඇසුරින් කේ. ඩී. දයානන්ද අධ්‍යක්ෂණය කළ 'ලොකු තාත්තා' ඒ සිනමා කෘතීන් වේ. කතා රචකයන් වූයේ පිළිවෙලින් වජිර ජයනෙත්ති හා ධර්මසිරි ගමගේ ය.

ඔහු ළමා කතා පොත් රාශියක් ද රචනා කර තිබේ. අරුම පුදුම කාසිය, කුරුලු උයන, සිංහ කොඩිය, රන් හදවත ඉන් කිහිපයකි.

ඇටසැකිල්ල, පණට පණ, මිනිස් දඩයම, මා ආලය කළ තරුණිය, යකඩ ගෑණි යන චිත්‍රකතාද එතුමා සහ පලාමල්ල යන කාටුනයන් ද පොත් වශයෙන් පළවී ඇත. ලේක්හවුස් ආයතනයේ වසර 42 ක සේවා කාලයෙන් වසර 18 ක් ම මධුර පත්තරයේ කතෘ ධූරය හෙබවීය. 1998 දී ලේක්හවුසියෙන් විශ්‍රාම ලැබීය.



37 පිටුවට




විශ්‍රාම ලැබුවද හෙතෙම තෙලිතුඩ පන්හිද අත්හැරියේම නැත. මල්ටිෆැක්ස් ආයතනයේ සිත්තර පත්තරයටද චිත්‍රකතා නිර්මාණය කළේය. පසුව ඔහු ලංකාදීප පුවත්පත හා සම්බන්ධ විය. ලංකාදීපය සමග අත්වැල් බැඳ ගැනීම ඔහුගේ කලා දිවියේ තවත් සුවිශේෂී මං සලකුණකි. ඕබ්රි කොලට්, ජී. ඇස් ප්‍රනාන්දු විසින් ඇරඹී ලාංකේය දේශපාලන කාටූන් කලාව තලංගම විසින් තවත් නව මානයකට රැගෙන ගියේය. ඒ Aතුමා සහ පලාමල්ල යන කාටූන් ද්විත්වය ඉදිරිපත් කරමින්ය. එතෙක් චිත්‍රකතා ශිල්පියකු කවියකු හා ලේඛකයකු ලෙස දස්කම් දැක්වූ ඔහු ප්‍රබල දේශපාලන කාටූන් ශිල්පියකු ලෙස ප්‍රතිනිර්මාණය විය. බොහෝ දේශපාලන කාටූන් ශිල්පීන් ඔවුන්ගේ කාටූන් සඳහා සංකේතාත්මකව යොදාගත්තේ කළු බඩ මහත දේශපාලනඥයෙක් සහ ඔවුන් විසින් පාලනය කරන රටක බැට කන, පීඩිත පන්තිය නියෝජනය කරන චරිතයකි. එහෙත් තලංගම මේ සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් තමන්ගේ Aතුමා කාටූනය සඳහා කළු බඩ මහත දේශපාලඥයා සමග පාතාල සාමාජිකයකු වූ සිරා නමැති චරිතය යොදා ගත්තේය. එය මෙරට ජරාජීර්ණ දේශපාලනයේ යථාර්ථය කදිමට නිරූපණය කළ සංකේතාත්මක චරිතයක් විය. නැව පතුලේ ඇති සිදුර පෙන්වා දෙනු මිස නැව් බඳේ තවරා ඇති වර්ණය හා එහි අලංකරණය ගැන කියා පෑම කාටූන් ශිල්පියාගේ කාර්යභාරය නොවන බව තලංගම විසින්ම පවසා තිබිණි. ඔහුගේ කාටූන් එකිනෙක ගෙන හැර බැලීමේදී ඒ බව මනාව පසක් වේ. විවිධ දේශපාලකයන්ගේ තොරතුරු හා ඔවුන්ගේ නිර්දය ප්‍රකාශ සදය උපහාසයට ලක්කරන්නේ කිසිඳු බලකඳවුරකට ගැති නොවී නිදහස් මතධාරියකු ලෙසය.

ඔහුගේ දේශපාලන කාටූන් පිළිබඳව විජය පුවත්පත් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික හා කීර්තිමත් මාධ්‍යවේදියකු වූ සිරි රණසිංහ මෙසේ පවසයි. "**තලංගම ජයසිංහයන් අපගේ ආරාධනාවකට අනුව ලංකාදීප පුවත්පතට එක්විය. අප ඔහුට ආරාධනා කළේ ඔහුගේ නිර්මාණ ජීවිතය පිළිබඳව මනා වැටහීමක් ඇති හෙයිනි. ඔහුගේ අවිය අපහාසය නොව උපහාසය වේ. ජරාජීර්ණ දේශපාලන සංස්කෘතියක ඇත්ත ඇතුළාන්තය මෙතරම් සුමට ලෙස පින්සලෙන් පින්තාරු කිරීමට ඔහු සතුව ඇති හැකියාව අපූරුය. හිමිදිරිය හිමිදිරියක්ම කිරීමට ඔහු සමත්ය. ඔහුගේ කාටූන මෙතරම් ජනප්‍රසාදයට පත්වීමට ඒ හැර අන් හේතුවක් නොමැත.**"

ලංකාදීප පුවත්පතට ඔහු ලියූ 'අනේද කියන්නේ' කවි සිව්පදය ද ඔහුගේ කාටූන තරමටම ප්‍රබලය. එය කදිම සමාජ විවරණයකි. පින්සලෙන් ඇඳෙන ඉරි කැබැල්ලක්, පෑනෙන් ලියැවෙන වචන කිහිපයක් සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් අවියක් ලෙස යොදාගත හැක්කේ රටක දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතිකමය වශයෙන් මනා දැනුමත් ඇති සහ ඒ පිළිබඳව නිරන්තරයෙන් යාවත්කාලීන වන අයෙකුට පමණි. තලංගම 88 වැනි වියේදී ද රට තොට පිළිබඳව යාවත්කාලීන වන්නේ නව යොවුන් වියේ තරුණයෙකු මෙන්ය. ඒ බව ඔහුගේ කාටූන් සහ කවි තුළින් පැහැදිලි වේ.

මෙලෙස හැට වසරකට අධික කලා දිවිය තුළ පන්හිඳෙන් හා පින්සලෙන් රසික ජනසමූහයා අමන්දානන්දයට පත් කළ නිර්මාණ ඉදිරිපත් කළ යුගයක පුරාවෘත්තයක් වූ තලංගම ජයසිංහයන් පසුගිය පෙබරවාරි 8 වනදා මෙලොවින් සදහටම සමුගත්තේ ලාංකේය කලා කෙත තුළ කිසිදා පිරවිය නොහැකි හිදැසක් තබමිනි. කලාව වෙනුවෙන් දිවියම කැපකළ ඔබට නිවන් සුව අත්වේවා!

**රංජිත් පුෂ්පකුමාර**

# කලකොළොප්පං - කාටූන් විශේෂාංගය













illustration , Digital Coloring & Copyright - Ranjith Pushpakumara

## මවකගේ පැතුම



රටක් වටින පුතෙක් මගේ කුසේ වැඩෙනවා
උතුරා යන ආදරයක් හදේ පිරෙනවා
පුංචි පුතා කුසේ ඉඳන් පෙරළි කරනවා
මගේ සිතේ පාට පාට සිහින මැවෙනවා

මවු පදවිය මටත් පුතුනෙ පිනට ලැබෙනවා
කියාගන්න බැරි සතුටක් සිතට දැනෙනවා
පුතුගෙ මුහුණ බලාගන්න පෙරුම් පුරනවා
රටක් වටින පුතෙක් හදන සිහින මැවෙනවා

**ආරියරත්න විතානගේ**

## නිමක් නැති බාධා එකින් එක දරාගනුමැයි ජීවිතේ

වැටෙන තැන්වල සටන අතහැර
බලා සිටියොත් හිතුමතේ
හිස මතත් පය තබන මිනිසුන්
හමුවේවි දිවි මාවතේ
විටෙක මහ කඳු විටෙක පල්ලම්
ඒ තමයි හැටි ජීවිතේ
අවැසි නම් නොවැටී ඇදෙන්නට
නොයන් කිසි විට නිදිමතේ
විටෙක මහ වැසි රැගෙන හෙන හඬ
හමා එයි දිවි මාවතේ
නිමක් නැති බාධා එකින් එක
දරාගනුමැයි ජීවිතේ

**මුහුණු පොතෙනි**



## අකුරු අරගෙන යන්න ඇවිත්

අකුරු අරගෙන යන්න ඇවිත්
අරුණටත් පෙර සාමලා
අනේ තාමත් ඇවිල්ලා නෑ
දිසාපාමොක් ඇදුරුලා

අහස යැදලා පොළොව වැඳලා
ගත්තු වී මලු සඟවලා
වටේටම ගිනි අවුළුවාගෙන
රැයම නිදි නෑ ඇහැරිලා
ඒත් අකුරක අගය මහරුයි
ආවෙ ඒකයි නිදිවරා

කඩුලු පන්නා තක්සලාවේ
අම්මා තවමත් මඟ ඇතී
තනියා පාරට එන්න කලියෙන්
යන්න ලැබුණොත් පින් ඇතී
තාත්තට පින් මදිව ගිය දා
තනියා දඬුවම් දුන් හැටී
මතක් වෙනකොට අනේ තවමත්
ඇසේ කඳුළක් නැති හැටී

**සුජීව ඉන්දික සිරිවර්ධන**

ඔබේ කාව්‍ය නිර්මාණ
ශ්‍රී පුර වෙත එවන්න

සයුරෙන් එහා



# ආසියාවේ පිරිසිදුම නගරයේ සංචාරයක්

අපිරිසිදු පරිසර ඇතුළත් වන ලැයිස්තුවක් සැකසුවහොත් එයට ඉන්දියාවේ නගර බොහොමයක් ඇතුළත් විය යුතු බව පරිසරවේදීහු පෙන්වා දෙති. මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ ක්‍රමවත් වැසිකිළි පද්ධතියක් මේ නගර සතු නොවීමය. ඇතැම්හු වැසිකිළි තිබුණද ඒවා පරිහරණය නොකර බඩවැටි සොයා යති.







මෙවන් සෞඛ්‍යාරක්ෂිත නොවූ තත්ත්වයක් තුළ 'ආසියාවේ පිරිසිදුම නගරය' ද ඉන්දියාවේම පිහිටා තිබීම සුවිශේෂත්වයකි. ඒ, මෙලින්නෝන් ගම්මානයයි. ඇසෑම් ප්‍රාන්තයේ අගනගරය වන ගුවාටිවලට නොදුරින් මෙය පිහිටයි.

මෙහි වැසියෝ (කාසි ජනයා) පිරිසිදුකම උපතින්ම උරුම කරගත් ජන කොටසකි. ඔවුහ් මේ පිරිසිදුකම දැනුම් තේරුම් වයසේ පටන් සිය දරු දැරියන්ගේ හිස් තුළට කාවද්දති. මෙහි වීදි දෙපස කුණු කසළ දැමීමට නියමිත දුරකින් යුතුව බඳුන් තබා තිබේ. වැඩිහිටියන් තම දූ දරුවන් කැටිව පාසල් යන විට මග දෙපස තිබෙනු දුටුවහොත් ඒවා අහුලා මේ බඳුන්වලට දැමීමට ඔවුන්ට හුරු පුරුදු කරවති.

මොලින්නෝන් වැසියන් සතු තවත් වැදගත් පුරුද්දක් වනුයේ දිරාපත් වන අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් පොහොර සකසා තම ගෙවතු වගාවන් සඳහා යොදාගැනීමය.

අද අප බොහෝ දෙනකුගේ පුරුද්ද වී තිබෙනුයේ කුණු කසළ බැහැරලීම පළාත් පාලන ආයතනවලට පමණක් පැවරී ඇති වගකීමක් සේ සලකා තම අත් පිසදා ගැනීමය. නමුත් මොලින්නෝන් වැසියෝ එසේ නොවෙති.

පිවිතුරු බවත් විසිතුරු බවත් හේතුවෙන් මේ වන විට මොලින්නෝන් ගම්මානය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් පෙදෙසක් බවටද පත්ව තිබේ. මේ හේතුවෙන් දෛනිකව එක්රැස් වන කුණු කසළ ප්‍රමාණයද ගොසිනි. මෙයට පිළියමක් සොයා ගම්වැසියෝ බට පතුරුවලින් කූඩ තනාගෙන ඒවාට කසළ එක්රැස් කරගෙන ජනයා අඩුවෙන් වෙසෙන ස්ථානවලට රැගෙන ගොස් පුළුස්සා දමති.

මෙලෙස එක්රැස් වන කුණු කසළ බැහැරලීමට සතියේ තෝරාගත් දිනයකදී ගම්වැසි සියල්ලෝම පහේ ඒකරාශී වී ශ්‍රමදාන සංවිධානය කිරීමේ පුරුද්දක්ද පවතී.

නරේන්ද්‍ර මෝදි අග්‍රාමාත්‍යවරයාගේ මුල් වීමෙන් 'පිරිසිදු ඉන්දියාවක්' සංකල්පය රට පුරා ක්‍රියාවට නැංවෙමින් තිබේ. ඒ යටතේ ගම්වැසියන් සිය වාසභූමිය සෞඛ්‍යාරක්ෂිතව හා පවිත්‍රව තබාගැනීමට දරන්නා වූ කැපවීම අගයමින් මොලින්නෝන් ඉන්දියාවේ පිරිසිදුම නගරය ලෙසින් සම්මානයට පාත්‍ර විය.

2003 දී 'ඩිස්කවරි ඉන්ඩියා' සඟරාව මගින් ආසියාවේ පිරිසිදුම ගම්මානය ලෙසින් මොලින්නෝන් නම්කළේය. මොලින්නෝන් අදටද ඒ ගෞරවණීයත්වය එලෙසින්ම රැකගෙන වැජඹේ.

**නදුන්**

දැනුම පොතට



# කොයි කවුරුත් කැමති චොකලට් ගැන රස වැහෙන කතා ටිකක්

චොකලට් යනු කොයි කවුරුත් අසීමිතව ප්‍රිය කරන රසකැවිල්ලකි. අද තත්ත්වය එසේ වුවත් ඈත අතීතයේදී චොකලට් ජනප්‍රිය වී ඇත්තේ 'තිත්ත රසයක් සහිත පානයක්' ලෙසිනි.

චොකලට්වල ඉතිහාසය පිළිබඳ කතා කිරීමේදී පුරාණ මායා ශිෂ්ටාචාරයට අයත් වැසියන් සහ දකුණුදිග මෙක්සිකෝව ආශ්‍රිතව ජීවත් වූ ඔලිමෙක්ස්වරුන් කිසිසේත්ම අමතක කළ නොහැකිය.

චොකලට් නිෂ්පාදනයේ මූලික අමුද්‍රව්‍යය කොකෝවා ඇට වේ. ඉතිහාසඥයින්ගේ මතය වන්නේ චාරිත්‍රානුකූල පානයක් නිපදවීමට කොකෝවා යොදාගන්නට ඇති බවය. ඔල්මෙක්ස්වරුන්ට ලිඛිත ඉතිහාසයක් නැත. එබැවින් මේ පානය නිපදවීමේදී ඔවුන් එයට කොකෝවා ඇට මිශ්‍ර කළාද නැත්ද යන්න පිළිබඳ නිගමනය කළ නොහැකි වේ.

ඔල්මෙක්ස්වරුන්ගෙන් ලද දැනුම උපයෝගී කරගත් මායාවරු කොකෝවා ඇට ආහාරයට ගත්හ. මායාවරු චොකලට් සලකා ඇත්තේ ඉමහත් ගෞරවනීය වස්තුවක් ලෙසිනි. උත්සව අවස්ථාවලදී හා වැදගත් ගනු දෙනු අවසන් කිරීමේදී චොකලට් පානයක් ලෙසින් භාවිත කර ඇති බව ඔවුන්ගේ ලිඛිත ඉතිහාස සාක්ෂ්‍යවලින් තහවුරු වී තිබේ. ඔවුන් නිපදවූ චොකලට් උකු සහ පෙණ සහිත වූ අතර බොහෝ විට ආහාරයට ගෙන ඇත්තේ මී පැණි, ජලය හෝ කොච්චි මිරිස් මිශ්‍ර කිරීමෙන් අනතුරුවය.



චොකලට් හා සබැඳි මායාවරුන්



## හෙන්රි නෙස්ලේ

කොකෝවා යනු දෙවියන්ගෙන් ලද තිළිණයක් ලෙසින් ඇස්ටෙක්වරු විශ්වාස කළහ. ශ්‍රේෂ්ඨ ඇස්ටෙක් පාලකයෙක් වූ 2 වැනි මෙන්ටෙසුමා ශක්තිය ලබාගැනීම සඳහා දිනපතාම චොකලට් ගැලුම් කිහිපයක් පානය කිරීමට පුරුදු වී සිටි බව කියවේ.

16 වැනි සියවස අගභාගය වන විට චොකලට් ස්පාඤ්ඤ රාජ සභාවේ ජනප්‍රිය ආහාරයක් බවට පත්වී තිබිණි. ක්‍රි. ව. 1585 වන විට ස්පාඤ්ඤය චොකලට් අපනපනය කිරීමට පටන්ගත්තේය. කෙටි කලකින්ම යුරෝපා මහාද්වීපයේ ජනප්‍රිය වූ චොකලට්වලට උක් යුෂ, කරුඳු හා තවත් රසකාරක මුසු කර පානය කිරීමට යුරෝපීයයෝ පුරුදු වූහ.

**Chocolate** යන ඉංග්‍රීසි වදන නිර්මාණය වී ඇත්තේද ස්පාඤ්ඤයේදීය. ඇස්ටෙක් ජනයා භාවිත කළ



42 පිටුවට

**Xocolatl** යන වදන ඇසුරින් නිර්මාණය වන්නට ඇතැයි සිතිය හැකිය. 'තිත්ත පානය' මේ වදනේ තේරුම වන්නේය.

ක්‍රි. ව. 1641 දී ස්පාඤ්ඤ නැවක් මගින් ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරීඩා ප්‍රාන්තයට චොකලට් රැගෙන ගියේය. ක්‍රි. ව. 1682 දී මුල්ම චොකලට් ව්‍යාපාරය අරඹා ඇත්තේ ඇමරිකාවේ බොස්ටන් නගරයේදීය. ඇමරිකානු විප්ලව සමයේදී හමුදා භටයින්ගේ ආහාරයක් ලෙසින් හා ඇතැම් අවස්ථාවලදී වැටුප් ලෙසින්ද චොකලට් ලබා දී තිබේ.



සෑම වසරකම ජූලි 07 වැනිදා 'ජාත්‍යන්තර චොකලට් දිනය' වශයෙන් නම් කර තිබේ. යුරෝපයට චොකලට් හඳුන්වා දී ඇත්තේ 1550 ජූලි 07 වැනිදා බවට සැලකේ.

අද වෙළෙඳ පොළේ චොකලට් වර්ග කිහිපයක් ඇත. **Milk chocolate, White chocolate, Dark chocolate, Unsweetened Chocolate** ලෙසිනි.

19 වැනි සියවස දක්වාම චොකලට් භාවිත වී ඇත්තේ ජලය හෝ කිරි සමග මුසු කර රසවිඳිය හැකි පානයක් ලෙසිනි. 1847 දී බ්‍රිතාන්‍ය ජාතික ජේ. එස්. ෆ්‍රයි සහ පුත්‍රයින් විසින් කොකෝවා, බටර්, සීනි මිශ්‍ර කර ලොව ප්‍රථම චොකලට් කුට්ටි **(Chocolate bar)** නිපදවා තිබේ.

අද අප දකින චොකලට්වලට සමාන ලෙසින් කෝකෝවා, කිරි, සීනි, බටර් මිශ්‍ර කර චොකලට් නිපදවා ඇත්තේ 1930 දී ස්විට්සර්ලන්ත ජාතිකයකු වූ නෙස්ලේ සමාගමේ නිර්මාතෘ හෙන්රි නෙස්ලේ ය.

අද ලෝකයේ වැඩියෙන්ම චොකලට් නිපදවන රටවල් වන්නේ ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ස්විට්සර්ලන්තය, ජර්මනිය, නෙදර්ලන්තය හා ප්‍රංසයයි.

ලෝකයේ මෙතෙක් නිෂ්පාදිත විශාලතම චොක්ලටයේ බර කිලෝග්‍රෑම් 5792 කි. 2011 දී මෙය නිපදවා ඇත්තේ බ්‍රිතාන්‍යයේ තෝර්ටන් පික් නමැත්තාය.

චොකලට් ආහාරයට ගැනීම හේතුවෙන් දිව පිනවීමට අමතරව තවත් වාසි රැසක් අත්වන බව විද්‍යාඥයෝ පවසති. මතක ශක්තිය යහපත් වීම, ලේ ගමනාගමනය සක්‍රිය වීම, හදවතේ නිරෝගී බව ඇතිවීම ඉන් කිහිපයකි.

"කොයි දේත් ඕනෑවට වඩා ඕනෑම නැත"යැයි කියමනක් තිබේ. චොකලට්වලටද මේ කතාව සාධාරණ වේ. එසේ කියන්නේ ඇයි? අධික ලෙස චොකලට්වලට හුරු වීමෙන් ශරීරයේ බර වැඩි වීම, මුහුණේ බහුලව කුරුලෑ ඇතිවීම, දියවැඩියාව වැළඳීම යන කාරණා සිදුවෙන්නට වැඩි ඉඩක් ඇති නිසාය.

හොඳින් මතක තබාගන්න. ඔබගේ නිවසේ සුරතලයට, රැකවරණයට ඇතිකරන සුනඛයාට කිසිදා චොකලට් දීමෙන් වළකින්න. හේතුව එමගින් ඔවුන්ගේ හදවතේ ක්‍රියාකාරීත්වය දුර්වල විය හැකි නිසාය.

**මනුලි ඩිහන්සා / 10 ශ්‍රේණිය**
**කො/සුජාතා බාලිකා විද්‍යාලය**

28 වැනි පිටුවෙන්...

"මේ උපකරණයෙ මොබයිල් ඇප්ලිකේෂන් එකක් සහ පළඳනාවක් තියෙනව. මෙහිදී දහදියේ සම්බන්ධතාව පිළිබඳ පාඨාංකයක් ලබාගෙන බ්ලූටූත් තාක්ෂණය හරහා එය මොබයිල් ඇප් එකට යැවිය යුතුයි. රුධිරගත සීනි මට්ටමට බලපාන වෙනත් කරුණුත් සම්බන්ධ කරගෙන මැෂින් ලර්නිං මොඩියුල් එකක් භාවිත කර ඒ අවස්ථාවේදී අදාළ පුද්ගලයාගේ රුධිරගත ග්ලූකෝස් මට්ටම ගණනය කිරීම සිදුකෙරෙනවා." නව නිපැයුමේ ක්‍රියාකාරීත්වය මධුෂි පැහැදිළි කළාය.


කැලණිය විශ්වවිද්‍යාලය වාර්ෂිකව සංවිධානය කරන **Hack X** තරගාවලියෙන් ප්‍රථම ස්ථානය ද මාලඹේ **SLITT Code Fest Designation** තරගාවලියේ තුන්වැනි ස්ථානයද මේ උපකරණයට හිමි විය.

මේ උපකරණයට ජාත්‍යන්තර මට්ටමෙන්ද වැදගත් වන සම්මානයක් හිමි වී තිබේ. ඒ අනුව 2019 වර්ෂයේදී වියට්නාමයේ පැවැති අන්තර්ජාතික **APICTA** සම්මාන උළෙලේදී මේ නිමැවුමට රන් සම්මානයක් හිමි විය. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අතිදැවැන්තයින් ලෙසින් හැඳින්වෙන රටවල් 17 ක් සම්බන්ධ වූ තරගයකදී පිරිනැමෙන එකම රන් සම්මානය මෙය වීම අප රට ලද සුවිශේෂ ජාත්‍යන්තර කීර්තියකි. මේ වන විට තම උපාධිය අවසන් කර මෘදුකාංග ඉංජිනේරුවරියක ලෙසින් සේවය කරන්නීය. එදිනෙදා ජීවිතයේදී වැදගත් වන නව නිපැයුම් රැසක් නිර්මාණය කිරීම අපගේ අපේක්ෂාවයි.

**සුනෙත් ජයකොඩි**

සත්තු විත්ති

# ලොවේ සුපිරිම වේගය චීටා



ක්ෂීරපායි සත්ත්වයෙකි. ලෝකයේ දැනට ජීවත් වන වේගයෙන්ම වේගයෙන්ම දිවීමේ හැකියාව ඇති සත්ත්වයා වේ. ඌට පැයට කිලෝමීටර් 105 ක පමණ වේගයෙන් තම ගොදුර වෙත ළඟා වීමේ හැකියාව ඇත.

ඇන්ටිලෝප්, ගසල්, ඉම්පාලා යන මුව වර්ග සහ කුළු ගවයකුගේ පෙනුමට තරමක් සමාන විල්ඩබීස්ට් යන සතුන් චීටාගේ ගොදුරු වේ. චීටා මොවුන් දඩයම් කරන්නේ කුසගිනි දැනුණු විට පමණි.

උතුරු, දකුණු, නැගෙනහිර අප්‍රිකානු රටවල සවානා වනාන්තර හා ඉරාන වනාන්තර චීටාගේ වාසභූමි වන්නේය.

වරකට පැටවුන් 3 ක් හෝ 8 ක් බිහිවේ. ඉපදී සති 7 ක් පමණ ඇතුළත මව පැටවුන්ට ගොදුරු සොයාගන්නා ආකාරය පුහුණු කරවයි.




අරුම පුදුම

# ලොව විශාලතම සිතියම් පොත

## Earth Platinum

**Earth Platinum** නම් වූ මෙහි උස මීටර 1.8 කි. පළල මීටර 1.4 කි. බර කිලෝග්‍රෑම් 150 කි. පිටු ගණන 128 කි. ලොව පුරා සිටින ප්‍රවීණතම සිතියම් විද්‍යාඥයින් 88 දෙනෙක් මෙය සකස් කිරීමට එක් වූහ.

මිලේනියම් හවුස් නම් ආයතනය මේ දැවැන්ත කෘතිය පළ කර ඇත. මුද්‍රණය කර තිබෙනුයේ ඉතාලියේදීය. දැනට මෙහි ඇත්තේ පිටපත් 31 ක් පමණි. මිල ඇමරිකානු ඩොලර් 100,000 කි.

මහාද්වීපවල ඉතා විශාල වූත් පැහැදිළි වූත් සිතියම් අන්තර්ගත වේ. අති නවීන තාක්ෂණික භාවිතයන් උපයෝගී කොටගෙන ලබාගත් ඡායාරූප 12000 ක් පමණ ඒකාබද්ධ කර මේ සිතියම් නිර්මාණය කර තිබීම සුවිශේෂත්වයකි.

සාගර පිළිබඳ ඉතාමත් සවිස්තරාත්මක වූ සිතියම් රැසක් මෙහි වේ. මේවායේ නෞකා මුහුදුබත් වූ ස්ථානයන්ද සලකුණු කොට තිබේ.

මේ දුර්ලභ සිකියම් පොතේ පිටපත් නවසීලන්ත ජාතික පුස්කාලයේ හා ඔස්ට්‍රේලියාවේ නිවුසවුත් වේල්ස් ජාතික පුස්තකාලයේ තැන්පත් කර තිබේ.

# ළමා පිටුව





## ඇයි..?

### පලතුරු ඉදෙන විට සුවඳක් විහිදෙන්නේ ඇයි?

පලතුරු ඉදෙන විට එස්තර් නම් වාෂ්පමය සංයෝගයක් පලතුරු තුළ නිපදවේ. එය ඉතා සුවඳවත්ය.

## ලෝකේ වටේ



## ජපානය

**තාක්ෂණික හා කාර්මික වශයෙන් ලොව ඉතාමත් දියුණු රටවලින් එකකි. ජපානය දූපත් කිහිපයකින් සමන්විත වී ඇති රටකි. විශාලතම දූපත හොන්ෂු ය.**

අයත් වන මහාද්වීපය - ආසියාව

විශාලත්වය - වර්ග කිලෝමීටර 377, 815

අගනුවර - ටෝකියෝ

මුදල් ඒකකය - යෙන්

නිල භාෂාව - ජපන්

ප්‍රධාන අපනයන භාණ්ඩ - වාහනේ, රථ වාහන, නැව්, විදුලි උපකරණ

ප්‍රධාන ආනයන භාණ්ඩ - ඛනිජ වර්ග, බොර තෙල්, ආහාර, අමුද්‍රව්‍ය

ප්‍රධාන නිෂ්පාදන - වාහනේ, යන්ත්‍ර සූත්‍ර, විදුලි උපකරණ, රසායන ද්‍රව්‍ය, රෙදිපිළි, මාළු, සහල්

## සිගිති සිත්තම්




ජේ.ඒ. මතිෂා මෙතුලි

2 ශ්‍රේණිය
ශ්‍රී සංඝමිත්තා බාලිකා විද්‍යාලය
කොළඹ 10



යෙනුක තවීශ් වීරතුංග

1 වැනි ශ්‍රේණිය
රෝයල් ඉන්ස්ටිටියුට් ජාත්‍යන්තර පාසල



පුංචි ඔබගේ නිර්මාණ මේ පිටුවේ පළ කිරීමට අදම එවන්න

kmcmediaunit3@gmail.com

## මුද්දර එකතු කරමු

# ආසියාවේ ප්‍රථම තැපැල් ප්‍රවාහණ සේවය ආරම්භ වේ




ලෝක තැපැල් ඉතිහාසයේ මෙන්ම ශ්‍රී ලංකා ප්‍රවාහණ ඉතිහාසයේ ඉමහත් අභිමානයක් සනිටුහන් කෙරෙමින් ප්‍රථම තැපැල් ප්‍රවාහණ සේවය 1832 පෙබරවාරි 10 වැනි දින ආරම්භ විය. තැපැල් ප්‍රවාහණය සඳහා අශ්වයින් බැඳි කරත්තයක් යොදාගැනිණි. මේ රථය කොළඹ සිට මහනුවර දක්වා ධාවනය විය. එවකට ලංකාණ්ඩුකාර ශ්‍රීමත් විල්මට් හෝර්ටන්ගේ මූලිකත්වයෙන් මේ සේවමය ආරම්භ විය.

කොළඹ සිට මහනුවර දක්වා සෑම තැපැල් කාර්යාලයකින්ම ලිපි හා තැපැල් භාණ්ඩ මේ රථයට භාරදිය යුතු විය. දිනපතා පෙරවරු 4.00 ට කොළඹ කොටුව රජගෙදර (වර්තමාන ජනාධිපති මන්දිරය) අසලින් පිටත් වූ මෙහි ගමන් කරන අයකු එක් ආසනයක් වෙනුවෙන් රුපියල් 2.10 ක් ගෙවිය යුතු විය.

1990 දෙසැම්බර් 26 වැනි දින නිකුත් කරනු ලැබූ ආසියාවේ ප්‍රථම තැපැල් ප්‍රවාහණ සේවය නිරූපිත මේ මුද්දරයේ වටිනාකම රුපියල් 5.00 කි.



## අපේ සිංහල පන්තිය — තනි පද

**වචන කිහිපයකින් කියවෙන අදහසක් එක් වචනයකින් දැක්වීම මෙහිදී සිදුකෙරේ.**

- ඇඳුම් මසන්නා - සන්නාලියා
- ගංගා, ඇළ දොළ, වැව්, පොකුණු ආදියේ ඇති ජලය - මිරිදිය
- ඉර පායන්නට පෙර නැගෙනහිර අහසේ පෙනෙන දීප්තිමත් පැහැය - අරුණාලෝකය
- ඉතා වේගවත් - අධිවේගී
- ඉබේ ක්‍රියා කරන - ස්වයංක්‍රිය
- උවමනා දෙයට පවා වියදම් නොකරන - මසුරු, ලෝභ
- උසාවියක නඩු විසඳන්නා - විනිශ්චයකාරවරයා
- උසාවියෙන් වරදකරුවන් වූවන් එල්ලා මරන තැනැත්තා - අළුගෝසුවා
- උස් බිමක ඇති සම බිම - සානුව
- උසස් කුලයට අයත් - කුලීන
- උපසම්පදා නොවූ භික්ෂුව - සාමණේර

## මාර්තු හා අප්‍රේල් මාසවල වැදගත් දින

**මාර්තු 08 - ජාත්‍යන්තර කාන්තා දිනය**

**මාර්තු 22 - ලෝක ජල දිනය**

**මාර්තු 23 - ලෝක කාලගුණ දිනය**

**අප්‍රේල් 07 - ලෝක සෞඛ්‍ය දිනය**

**අප්‍රේල් 18 - ලෝක උරුම දිනය**

**අප්‍රේල් 22 - ලෝක මිහිතල දිනය**

# කතා කරන පින්තූර

## ජල බිඳු මවන සොඳුරු රටා





ජලය අපට නැතිවම බැරි සම්පතකි. ඒ, එය ජීවයේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් වන නිසාය. ජලය අපේ නෙතට සොඳුරු බවද ගෙන දෙයි. මේ සේයා රූ පෙළ අපට කියන්නේ ඒ බව ය.





තොරතුරු හා ඡායාරූප :
**අන්තර්ජාලය ඇසුරිනි**